# (ඉ) රජයේ මුදල් පරිහරණය

අ කොටස-1964/1965 මුදල් වර්ෂය

1964 ඔක්තෝබර් මාසයේ සිට 1965 සැප්තැම්බර් මාසය තෙක් වූ මුදල් වර්ෂය සඳහා ලංකාණ්ඩුවේ ගිණුම් සාරාංශය පසුගිය වර්ෂවල අනුරූප සංඛ්‍යා තොරතුරු ද සමග II (ඉ) 1 සංඛ්‍යා සටහනේ දැක්වේ. මෙම සටහනෙහි දක්වා ඇති පරිදි අයවැය ලේඛන ගනුදෙනුවල ප්‍රධාන ලක්‍ෂණ මෙසේය:—

(අ) 1964/65 රජයේ මුළු ආදායම රුපියල් කෝටි 181·64 ක් විය. 1963/64 දී මුළු ආදායම රුපියල් කෝටි 175·90 ක්වූ අතර, 1962/63 දී රුපියල් කෝටි 159·34 ක් විය.

(ආ) 1964/65 සම්මත මුළු වියදම[1] රුපියල් කෝටි 227·13 ක් විය. 1963/64 සම්මත මුළු වියදම රුපියල් කෝටි 223·66 ක්වූ අතර, 1962/63 දී එය රුපියල් කෝටි 199·87 ක් විය. 1964/65 ආවර්තන වියදම රුපියල් කෝටි 180·36 ක් විය. 1963/64 ආවර්තන වියදම රුපියල් කෝටි 183·41 ක්වූ අතර, 1962/63 ආවර්තන වියදම රුපියල් කෝටි 159·64 ක් විය. ප්‍රාග්ධන වැය සම්මත වලට වැයවන වියදම 1964/65 දී රුපියල් කෝටි 46·77 ක් විය. එය 1963/64 දී රුපියල් කෝටි 40·25 ක්ද, 1962/63 දී රුපියල් කෝටි 40·23 ක්ද වූයේය.

(ඇ) අත්තිකාරම් ගිණුම් ගනුදෙනු නිසා රුපියල් කෝටි 1·24 ක් (ශුද්ධ) ලැබිණි. 1963/64 දී මෙමගින් රුපියල් කෝටි 1·61 ක් (ශුද්ධ) හා 1962/63 දී රුපියල් කෝටි 1·37 ක් (ශුද්ධ) ලැබී ඇත.

(ඈ) මෙම ගනුදෙනු[2] හේතු කොටගෙන රජයට ඇතිවූ ශුද්ධ අයවැය හිඟය රුපියල් කෝටි 44·25 ක් විය. 1963/64 දී රුපියල් කෝටි 46·17 ක හිඟයක් ඇතිවූ අතර, 1962/63 දී ඇතිවූ හිඟය රුපියල් කෝටි 39·17 ක් විය.

(ඉ) 1964/65 අයවැය හිඟය පියවීම සඳහා රජය දේශීය වෙළෙඳ පොළෙන් රුපියල් කෝටි 26·09 ක් ණයට ගත් අතර, පරිපාලන ණය මගින් රුපියල් කෝටි 5·67 ක්ද, විදේශ මාර්ග වලින් රුපියල් කෝටි 10·01 ක්ද, මුදල් ශේෂ අඩු කිරීමෙන් රුපියල් කෝටි 2·48 ක්ද[3] ලබාගන්නා ලදී.

(ඊ) එක්සත් ජනපද ප්‍රතිපාර්ශ්වීය අරමුදල්වල ඇතිවූ වෙනස්වීම් වෙනුවෙන් ගැලපූවිට, ශුද්ධ අය-වැය හිඟය නිසා 1964/65 දී ඇතිවූ ප්‍රසාරණාත්මක බලපෑම රුපියල් කෝටි 4·0 ක් විය. මෙය 1963/64 දී රුපියල් කෝටි 16·29 ක්වූ අතර, 1962/63 දී රුපියල් කෝටි 16·20 ක් විය.

---

1. II (ඉ) I සංඛ්‍යා සටහනේ I ආ (1) හා I ආ (II) ශීර්ෂ යටතේ වූ එකතුව
2. ජාතික සංවර්ධන සංචිතයට අය කැරෙන රුපියල් කෝටි 0·01 ක්ද ඇතුළත් වෙයි.
3. 1965–9–30 වැනි දිනටවූ ශේෂ පත්‍රය (තාවකාලික) අනුව මුදල් හා බැංකු ශේෂ, නියම ප්‍රමාණයට වඩා රුපියල් කෝටි 1·77 ක් ගෙන ඇති බැව් පිළිබිඹු වේ.

## සංඛ්‍යා සටහන II (ඉ) 1

### රජයේ ශුද්ධ අය වැය

| | 1954/55 | 1955/56 | 1956/57 | 1957/58 |
|---|---|---|---|---|
| **1. ශුද්ධ අයවැය අතිරික්තය/හිගය ( – )** .. | 127.6 | – 1.2 | – 196.4 | – 222.3 |
| **අ. ආදායම** .. | 1,158.6 | 1,257.2 | 1,260.5 | 1,280.0 |
| **ආ. වියදම (එනම්, ණය ගැනීම හෝ ණය ගනුදෙනුවල ශුද්ධ ලැබීම හෝ ගෙවීම අත්හැර මුළු ගෙවීම්)** .. | –1,031.0 | –1,258.4 | –1,456.9 | –1,502.3 |
| (1) ආවර්තන වියදම් (අ) (ආ) * .. | –864.9(උ) | –1,014.4 | –1,105.2 | –1,280.1 |
| (2) ප්‍රාග්ධන වියදම් (අ)* .. | – 215.5 | – 211.0 | – 213.3 | – 282.6 |
| (3) ජාතික සංවර්ධන සංචිතයට අය වෙන වියදම් .. | – 2.1 | – 4.0 | – 5.1 | – 3.0 |
| (4) නිකුත් නොකළ ගබඩා තොග හා උපකරණ (ඇ) | 9.9 | 1.2 | – 14.5 | — |
| (5) රජයේ දෙපාර්තමේන්තුවලට අත්තිකාරම් (ඇ) ..<br>(6) ලංකා චීන වෙළෙඳ ගිණුම් (ඇ) .. | 34.0 | – 30.3 | – 115.8 | 54.5 |
| (7) විවිධ .. | 7.6 | 0.1 | – 3.0 | 8.9 |
| **හිගය පියවීම** | | | | |
| **2. රාජ්‍ය ණය ගනුදෙනු වලින් උද්ගතවන (ශුද්ධ) ලැබීම් හා ගෙවීම් (—) සහ විදේශීය දීමනා ලැබීම්** .. | – 39.0 | 12.2 | 175.4 | 174.7 |
| **අ. පරිපාලන ණය ගැනීම් හා ණය ගෙවීම්** (විවිධ කටයුතු සඳහා ගත් ණය ඇතුළුව) | 29.1 | – 36.5 | – 9.4 | 72.5 |
| (1) තැන්පතු (ඈ) .. | 34.5 | – 10.8 | 9.0 | 73.9 |
| (2) විවිධ අරමුදල් (ඉ) .. | – 0.9 | – 4.8 | – 2.3 | 20.1 |
| (3) විවිධ ණය (ඊ) .. | – 4.5 | – 20.9 | – 16.1 | – 21.5 |
| **ආ. දේශීය වෙළෙඳ පොළේ ණය ගැනුම් හා ගත් ණය ආපසු ගෙවීම්** .. | – 76.7 | 47.0 | 169.7 | 81.9 |
| (1) රුපියල් ණය .. | 75.0 | 74.5 | 94.9 | 45.0 |
| නිදන් අරමුදල් දයක දීමනා අන්හැර .. | 41.0 | 35.5 | 27.6 | 23.1 |
| | 34.0 | 39.0 | 67.3 | 21.9 |
| (2) භාණ්ඩාගාර බිල් .. | – 44.9 | 8.0 | – 3.0 | 74.6 |
| (3) මහ බැංකුවේ අත්තිකාරම් .. | – 65.8 | — | 96.3 | – 13.8 |
| (4) බදු සංචිත සහතික .. | — | — | 9.1 | – 0.8 |
| **ඇ. විදේශීය මුදල්** .. | 8.6 | 1.7 | 15.1 | 20.3 |
| (1) ණය .. | 12.1 | 5.2 | 18.6 | 23.7 |
| නිදන් අරමුදල්, දයක දීමනා හා ආදායමෙන් ගෙවන අවක්‍ර රාජ්‍ය ණය බේරීම් අත්හැර .. | 3.5 | 3.5 | 3.5 | 3.4 |
| | 8.6 | 1.7 | 15.1 | 20.3 |
| (2) දීමනා .. | — | — | — | — |
| **3. මුදල් ශේෂයන්ගේ වෙනස්වීම් (පහසුවෙන් මුදල් කළහැකි වත්කම් ඇතුළුව)** .. | 88.6 | 11.0 | – 21.0 | – 47.5 |

(අ) 1960/61 මුදල් වර්ෂයේ සිට ''ආදායමට අයවෙන වියදම්'' සහ ''ණය අරමුදල්වලට අය වෙන වියදම්'' යනුවෙන් වියදම් වර්ග කිරීමේ මෙතෙක් පැවති ක්‍රමය අත්හරින ලදී. ප්‍රතිශෝධිත වර්ග කිරීමේ ක්‍රමය, ඇස්තමේන්තුවල 1 වැනි පිටුවේ සටහනක දක්වෙයි. එහි, රජයේ මුළු වියදම වැය ශීර්ෂ 7 කට බෙදු දක්වා ඇත. මේ සටහනෙහි, වැය ශීර්ෂ 1, 2, 4 හා 6 යටතේ දක්වා ඇති පෞද්ගලික වැටුප් සහ වර්තන වියදම් ද, වැය ශීර්ෂ 3, 5 හා 7 යටතේ ප්‍රාග්ධන සඳහා වූ මුළු වියදම් ද පිළිවෙළින් ආවර්තන වියදම් හා ප්‍රාග්ධන වියදම් වශයෙන් දක්වා ඇත. 1960/61 වර්ෂයට පෙර වර්ෂය සඳහා මෙවැනි වර්ග කිරිමෙක් නොමැති නිසා, ආදායමට අයවෙන වියදම් හා ණය අරමුදල්වලට අයවෙන වියදම් වෙන වෙනම ආවර්තන වියදම් හා ප්‍රාග්ධන වියදම් වලට සමාන වෙතැයි සලකනු ලැබේ.

* ගතවූ මුදල් වර්ෂ වලදී වැයවූ ණය කාර්යයන් සඳහා අත්තිකාරම් ගිණුම්හි පාඩු වර්තන වියදම් හා ප්‍රාග්ධන වියදමට මාරු කිරීමෙන් උද්ගතවන පොත් ගැලපිලි (හර සහ බැර) අත්හැර ඇත. එබැවින් ලංකාණ්ඩු වෙහි ගිණුම්වල සංඛ්‍යාවන් හා මෙහි සංඛ්‍යාවන් නොසැසඳේ.

(ආ) නිදන් අරමුදල් දයක දීමනා හා ආදායමෙන් ගෙවන අවක්‍ර රාජ්‍ය ණය බේරීම් අත්හැර ඇත. 2 ආ (1) සහ 2 ඇ (1) බලන්න.

(ඇ) මුදල් වර්ෂය අවසානයේදී වූ වෙනස (ශුද්ධ) දක්වෙයි. ලංකා චීන වෙළෙඳ ගිණුම පිළිබඳ විස්තර 1944/55 සිට 1960/61 වූ වර්ෂ සඳහා වෙන වෙනම ලබා ගැනීමට නොමැත.

(ඈ) නඩු කියන්නන්ගෙන්; කොන්ත්‍රාත්කරුවන් යනාදීන්ගෙන්; 1959/60 දක්වා වියදම් නොකොට ඉතිරි වී ඇති විදේශාධාර ඇතුළත් වෙයි.

අතිරික්තය / හිගය ( − )

රුපියල් දශ ලක්ෂ

| 1958/59 | 1959/60 | 1960/61 (එ) | 1961/62 | 1962/63 | 1963/64 | 1964/65 (ඔ) |
|---|---|---|---|---|---|---|
| − 413·4 | − 417·5 | − 462·5 | − 456·1 | − 391·7 | − 461·7 | − 442·5 |
| 1,330·4 | 1,403·8 | 1,513·9 | 1,620·6(ඒ) | 1,593·4(ඒ) | 1,759·0(ඒ) | 1,816·4(ඒ) |
| −1,743·8 | −1,821·3 | −1,976·4 | −2,076·6 | −1,985·3 | −2,220·7 | −2,259·0 |
| −1,432·2 | −1,511·9 (ඌ) | −1,540·8 (ඌ) | −1,580·7 (ඌ) | −1,596·4 (ඌ) | −1,834·1 (ඌ) | −1,803.6 (ඌ) |
| − 303·4 | − 306·6 | − 419·9 | − 480·6 | − 402·3 | − 402·5 | − 467·7 |
| − 2·4 | − 1·5 | − 1·5 | − 0·7 | − 0·3 | − 0·2 | − 0·1 |
| 10·5 | − 7·1 | 1·9 | 2·4 | − 8·6 | − 5·2 | 2·7 |
| − 17·1 | 5·8 | − 15·9 | 10·2 | 7·6 | − 45·9 | 82·4 |
| | | | − 26·0 | 20·3 | 61·0 | − 70·4 |
| 0·8 | — | − 0·2 | − 1·2 | − 5·6 | 6·2 | − 2·3 |
| 351·8 | 411·6 | 462·5 | 496·3 | 391·3 | 416·3 | 417·7 |
| 27·6 | 57·4 | 29·4 | 104·5 | − 33·8 | − 1·9 | 56·7 |
| 27·3 | 62·3 | 36·5 | 98·4 | − 28·0 | 0·2 | 66·0 |
| 4·2 | 2·7 | − 1·0 | 4·8 | 0·1 | 2·5 | − 3·1 |
| − 3·9 | − 7·6 | − 6·1 | 1·3 | − 5·9 | − 4·6 | − 6·2 |
| 294·6 | 330·5 | 409·4 | 339·0 | 333·1 | 322·8 | 260·9 |
| 95·0 | 134·8 | 214·9 | 145·0 | 205·0 | 245·0 | 253·1 |
| 26·3 | 27·7 | 29·2 | 35·0 | 38·9 | 44·6 | 51·2 |
| 68·7 | 107·1 | 185·7 | 110·0 | 166·1 | 200·4 | 201·9 |
| 179·0 | 228·2 | 198·4 | 248·0 | 124·1 | 128·4 | 50·5 |
| 41·1 | 3·1(ඌ) | 20·6(ඌ) | − 21·0(ඌ) | − 36·6(ඌ) | − 19·4(ඌ) | 8·3(ඌ) |
| 5·8 | − 7·9 | 4·7 | 1·9 | 6·3 | 13·4 | 0·2 |
| 29·6 | 23·7 | 23·7 | 52·9 | 92·0 | 95·4 | 100·1 |
| 35·5 | 29·3 | 16·3 | 44·5 | 68·7 | 75·7 | 92·8 |
| 5·9 | 5·6 | 5·9 | 9·7 | 7·8 | 12·2 | 17·2 |
| 29·6 | 23·7 | 10·4 | 34·8 | 60·9 | 63·5 | 75·6 |
| — | — | 13·3 | 18·1 | 31·1 | 31·9 | 24·5 |
| − 61·7 | − 6·0 | ... | 40·2 | − 0·4 | − 45·4 | − 24·8 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

(ඉ) වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල, රජයේ සේවකයන්ගේ අර්ථ සාධක අරමුදල යනාදිය.

(ඊ) මෙම ණය, කෘෂිකාර්මික හා කාර්මික ණය දෙන ආයතනය, ප්‍රාදේශීය ණය හා සංවර්ධන අරමුදල හා පලාත් පාලන මණ්ඩල ආදියට දෙන ලදී

(උ) 1954/55 හේ ආහාර ආධාර සඳහා වූ රුපියල් කෝටි 3·6 ක මුදලක් අත්තිකාරම් ගිණුමේ සිට 1958/59 දී ආවර්තන වියදමට මාරුකරන ලදී. මේ පොත් ගැලපිල්ල 1958/59 සංඛ්‍යාවන්ගෙන් ඉවත්කර තිබුණ ද (සංලක්ෂ්‍යය බලන්න) 1954/55 සංඛ්‍යාවන් එය ඇතුළත් කිරීමෙන් සංශෝධනය කර ඇත.

(ඌ) 1959/60 දී ගෙවනලද රුපියල් කෝටි 3·7 ක ජාත්‍යන්තර මුදල් මණ්ඩලය වැඩිකළ දායක දීමනාව ද 1960/61 දී ජා.ප්‍ර.ස.බැ.ට සහ ජා. ස ස. ට කළ රුපියල් කෝටි 0·22 ක ගෙවීමද, 1961/62 සිට 1963/64 දක්වා වාර්ෂිකව ජා. ස. ස. ට කළ රුපියල් කෝටි ·02 ක ගෙවීමද, මහ බැංකුවෙන් ලත් විශෙෂ ණය කින් ජා. මු. අ. ට, ජා. ස. ස. ට හා ජා. ප්‍ර. ස. බැ. ට කළ විශේෂ ගෙවීම් බේරීමට 1964/65 දී දුන් රුපියල් කෝටි 2·15 ක ගෙවීමද අත්හැර ඇත.

(එ) 1960/61 සිට විදේශ දීමනා වලට අයවුන ප්‍රාග්ධන වියදම් අය වැය ලේඛනයට ඇතුළත් කැරිණ. 1960/61 ට පෙර විදේශ දීමනාවලින් වියදම් නොකොට ඉතිරිවූ, භාණ්ඩාගාරයේ අයවැය මුදල් මාර්ගයක්ව පැවැති, ශේෂ පමණක් පරිපාලන ණය ගිණුම් යටතේ ඇතුළත් කැරිණි.

(ඒ) II වැනි පරිශිෂ්ටයේ 17 වැනි සංඛ්‍යා සටහනේ (ආ) අධෝලිපිය බලන්න.

ඔ) තාවකාලිකයි.

**ආදායම**

1963/64 මුදල් වර්ෂයේ ආදායම සැලකිය යුතු ලෙස වැඩිවීම එම වර්ෂයෙහි අයවැය ගනුදෙනු වල සතුටුදායක ලක්‍ෂණ වලින් එකක් ලෙස 1964 වාර්ෂික වාර්තාවේ සඳහන් කිරීමට අවසථාව ලැබිණි. මේ ලක්‍ෂණය 1964/65 මුදල් වර්ෂ යේ ද එලෙස ම පවත්වා ගෙන ගොස් ඇත. ප්‍රධාන අය ශීර්ෂ යටතේ රජයේ ඇස්තමේන්තු වල දක්වෙන පරිදි, 1964/65 ඇස්තමේන්තු කළ ආදායම සහ නියම වශයෙන් එකතු වූ ආදායම (තාවකාලික) II වැනි පරිශිෂ්ටයේ 18 වැනි සංඛ්‍යා සටහනේ දක්වා ඇත. 1964/65 නියම (තාවකාලික) ආදායම රුපියල් කෝටි 181·64 ක් විය මෙය 1963/64 අනුරූප සංඛ්‍යාවට (රුපියල් කෝටි 175·90) වඩා රුපියල් කෝටි 5·74 කින් හෙවත් සියයට 3·3 කින් වැඩි ය.

## සංඛ්‍යා සටහන II (ඉ) - 2

### රජයේ ආදායම

රුපියල් දශ ලක්ෂ

| | 1964/65 මුල් ඇස්ත මේන්තු | 1964/65 නියම (තාවකාලි කයි) | 1963/64 නියම | 1963/64 ට වඩා 1964/65 වෙනස (නියම) | 1964/65 මුල් ඇස්ත මේන්තු හා සසඳන කල 64/65 (නියම) අධිකය (+) හෝ අඩුවීම (−) |
|---|---|---|---|---|---|
| 1. අපනයන බදු (අ) * | 313·8 | 312·8 | 277·4 | 35·4 | − 1·0 |
| (අ) තේ (තේ බද්ද ඇතුලු) | 239·8 | 228·8 | 218·0 | 10·8 | − 11·0 |
| (ආ) රබර් | 33·9 | 22·4 | 11·8 | 10·6 | − 11·5 |
| (ඇ) පොල් | 33·8 | 56·1 | 41·6 | 14·5 | +22·3 |
| 2. ආනයන බදු (ආ) * | 520·1 | 435·9 | 481·6 | −45·7 | − 84·2 |
| (අ) කපු නූල් කැරලි හා රෙදි | 23·0 | 29·5 | 47·5 | − 18·0 | + 6·5 |
| (ආ) ධාන්‍ය හා පිටි | 24·4 | 19·8 | 29·3 | − 9·5 | − 4·6 |
| (ඇ) භූමිතෙල්, මෝටර් තෙල් යනාදිය | 135·0 | 115·4 | 88·3 | 27·1 | − 19·6 |
| (ඇ) දුම්කොල හා සිගරැට් | 40·0 | 42·5 | 39·8 | 2·7 | + 2·5 |
| (ඉ) සීනි | 37·7 | 23·3 | 33·8 | − 10·5 | − 14·4 |
| (ඊ) අනෙකුත් භාණ්ඩ † | 202·0 | 133·4 | 180·9 | −47·5 | − 68·6 |
| 3. ආදායම් බද්ද (අධි භාරය හැර) | 223·1 | 291·2 | 281·3 | 9·9 | +68·1 |
| 4. පෞද්ගලික බද්ද | 30·5 | 18·9 | 12·7 | 6·2 | − 11·6 |
| 5. අරක්කු විකිණීමෙන් ලාභ | 83·0 | 90·0 | 88·0 | 2·0 | 7·0 |
| 6. දුම්කොල බද්ද | 92·6 | 110·3 | 92·3 | 18·0 | 17·7 |
| 7 පිරිවැටුම් බද්ද | 32·0 | 34·8 | 16·0 | 18·8 | 2·8 |
| 8. කළුතෙල් මෝටර්රථ බද්ද | 18·8 | 41·9 | 14·5 | 27·4 | 23·1 |
| 9. අනෙකුත් ආදායම් | 507·4 | 480·6 | 495·2 | − 14·6 | − 26·8 |
| එකතුව | 1821·3 | 1816·4 (ඇ) | 1759·0(ඇ) | 57·4 | − 4·9 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

(අ) විවිධ බදු ඇතුළති (1 වැනි ශීර්ෂයේ 3 වැනි උප ශීර්ෂය)

(ආ) බලපත්‍ර යටතේ තිබෙන ආනයන බලපත්‍ර ගාස්තු ඇතුළති (5 වැනි ශීර්ෂයේ 7 වැනි උප ශීර්ෂය බලන්න)

(ඇ) II පරිශිෂ්ටයේ 17 වැනි සංඛ්‍යා සටහනේ (ආ) අධො ලිපියෙහි දක්වා ඇති හේතූන් නිසා ආදායම් සංඛ්‍යා රජයේ ඇස්තමේන්තුවල දක්වා තිබෙන සංඛ්‍යාවලට වඩා වෙනස් වෙයි

† රජයේ ආදායම් විග්‍රහයේ දක්වා ඇති ශීර්ෂයකි. (1 වැනි ශීර්ෂයේ උප ශීර්ෂ 1 (9))

* ශීර්ෂයනට ප්‍රධාන අයවීම් පමණක් ඇතුලත් වන බැවින් ප්‍රධාන ශීර්ෂයන්ගේ එකතූන් හා ඒවාට ඇතුලත් වන ශීර්ෂයන්ගේ එකතූන් එකටෙක ගැලපෙන්නේ නොවේ.

1954/55 සිට 1964/65 දක්වා වූ දශකය තුළ රජයේ ආදායම සියයට 56·8 කින් හෙවත් වාර්ෂිකව සියයට 4·6 (සංයුක්ත) බැගින් වැඩි වී ඇත. මෙයින් ආදායම වැඩි කර ගැනීම සඳහා රජය ගෙන ඇති තැත පැහැදිලි වෙයි. 1959/60 සිට 1964/65 දක්වා වූ පස් වස තුළ රජයේ ආදායම සියයට 29·4 කින් හෙවත් වාර්ෂිකව සියයට 5·3 (සංයුක්ත) බැගින් වැඩි වී ඇත. ඉකුත් පස් වසෙහි රජයේ ආදායම් සාමාන්‍යය, සාධක මිල අනුව, දළ දේශීය නිෂ්පාදිතයෙහි අනුපාතයක් වශයෙන් ගත් කල සියයට 22·6 ක් හා සියයට 25·0 ක් අතර වෙයි. මෙය සංවර්ධනය වෙමින් පවත්නා අර්ථ ක්‍රමයක කලාතුරකින් ලැබිය හැකි ලොකු අනුපාතයකි

1964/65 මුල් ඇස්තමේන්තුව වූ රුපියල් කෝටි 182·13, ලැබුන නියම ආදායම හා සසඳන විට, අඩු වී ඇත්තේ රුපියල් කෝටි 0·49 කින් පමණකි. 1963/64 මුදල් වර්ෂයේ ආදායම් ඇස්තමේන්තු රුපියල් කෝටි 3·41 කින් වැඩිවීම හා සමයා බලන විට මේ අඩුවට වැඩි සැලකිල්ලක් යොමු විය යුතු නොවේ. 1962/63 දී ආදායම රුපියල් කෝටි 12·35 කින් ද 1961/62 දී රුපියල් කෝටි 15·61 කින් ද වැඩියෙන් ඇස්තමේන්තු කර තිබිණි.

II (ඉ) 2 සංඛ්‍යා සටහනින් 1964/65 ප්‍රධාන ආදායම් ශීර්ෂ යටතේ ලැබුනු නියම ආදායම් වල (තාවකාලික) ඇති වූ ප්‍රධාන වෙනස්කම් සවිස්තරව දක්වා ඇති අතර, 1963/64 නියම ආදායම හා 1963/64 මුල් ඇස්තමේන්තු සමඟ සසඳා ඇත.

1964/65 අපනයන බදු වලින්[1] ලැබුන ආදායම 1963/64 ඉන් ලැබුන ආදායම හා සසඳන විට, රුපියල් කෝටි 3·54 කින් වැඩිය. මෙසේ ආදායම වැඩි වූයේ තේ බදු වලින් ලද ආදායම රුපියල් කෝටි 1·08 කින් ද රබර් හා පොල් නිෂ්පාදිත වලින් ලද බදු ආදායම් පිළිවෙළින් රුපියල් කෝටි 1·06 කින් හා රුපියල් කෝටි 1·45 කින් ද වැඩිවීම නිසාය. තේ අපනයනයෙන් ලද ආදායම වැඩි වූයේ තේ රාත්තලක සාමාන්‍ය නැ. වි. ස. මිල සත 2 කින් රුපියල් 2·47 දක්වා අඩු වී තිබිය දීත් ය. එසේ වැඩිවීමට හේතු වූයේ තේ අපනයනය රාත්තල් කෝටි 0·51 කින් වැඩිවීමය[2]. එසේ ම රබර් අපනයන බදු ආදායම වැඩිවීමට ද හේතු වූයේ රබර් අපනයන පරිමාව රාත්තල් කෝටි 2·08 කින් වැඩිවීමය. එහෙත් මුදල් වර්ෂය තුළ රබර් රාත්තලක සාමාන්‍ය නැ. වි. ස. මිල[3] සත 2 කින් රුපියල් 1·14 දක්වා පහත වැටීම නිසා එහි වැඩිවීම තරමක් දුරට මැකී ගියේ ය. අනෙක් අතට, පොල් නිෂ්පාදිත අපනයන බදු ආදායම වැඩිවීමට අපනයන මිල වැඩිවීම හේතු විය. එහෙත් අපනයන පරිමාව අඩුවීම නිසා එය තරමක් මැකී ගියේය. 1963/64 දී කොප්පරා අපනයනය ටොන් 59,300 ක් වුවද, 1964/65 දී එය ටොන් 44,900 දක්වා අඩු විය. 1963/64 දී කපාපු පොල් හා පොල්තෙල් අපනයනය පිළිවෙළින් ටොන් 55,100 හා ටොන් 1,04,500 වුවද, 1964/65 දී එය පිළිවෙළින් ටොන් 51,500 හා ටොන් 1,03,800 දක්වා අඩු විය මෙසේ අපනයන පරිමාව අඩු වුවද, 1963/64 දීට වඩා වාසි සහගත මිලක් ලැබුන නිසා, බදු අනුපාතිකයන් වඩාත් වැඩිවීමෙන් අපනයන පරිමාව අඩුවීම නිසා වූ අවාසිය පමණටත් වඩා මැකී ගියේ ය.[4] තෙවැදෑරුම් පොල් නිෂ්පාදිතයන්ගේ හොණ්ඩරයක සාමාන්‍ය නැ. වි. ස. මිල රුපියල් 59·07 සිට රුපියල් 72·58 දක්වා වැඩි විය.

---

1. කොළඹ හා ලන්ඩනයේ තේ වෙන්දේසි වල දී අය කැරුන බද්ද ඇතුළත්ය.
2. 1964/65 වර්ෂයේ දී තේ අපනයනය රාත්තල් කෝටි 47·8 ක් විය. 1963/64 දී එය රාත්තල් කෝටි 47·24 ක් විය.
3. 1963 නොවැම්බර් 28 වැනි දින සිට රබර් අපනයන බදු සැකැසී ඇත්තේ විචල්‍ය ක්‍රමයක් අනුවය
4. පොල් නිෂ්පාදිත සඳහා වූ බදු සැකැසී ඇත්තේ, විචල්‍යය ක්‍රමයකට අනුවය.

1964/65 මුදල් වර්ෂයේ ආනයන[1] වලින් ලද ආදායම කලින් වර්ෂයේ දී ලද ආදායමට වඩා රුපියල් කෝටි 4·75 කින් සැලකිය යුතු අන්දමින් පහළ වැටී ඇත. කපු නූල් ආදියෙන් ලද ආදායම (රුපියල් කෝටි 1·80 කින්) අඩු වූ අතර, ධාන්‍ය හා පිටි (රුපියල් කෝටි 0·95 කින්), සීනි (රුපියල් කෝටි 1·05 කින්) හා "අනෙකුත් භාණ්ඩ" (රුපියල් කෝටි 4·75 කින්) අඩු වූ අතර, මුළු වශයෙන් වූ අඩුව රුපියල් කෝටි 8·55 ක් විය. එහෙත් මේ අඩුව, භූමිතෙල්[2], මෝටර් ස්ප්‍රිතු, ද්‍රව ඉන්ධන (රුපියල් කෝටි 2·71)[2] හා දුම්කොළ සහ සිගරැට් (රුපියල් කෝටි 0·27) ආනයනයෙන් ලැබුන බදු ආදායම් විශාල ලෙස වැඩිවීමෙන් තරමක් දුරට මැකී ගියේ ය. කපු නූල් ආදිය, ධාන්‍ය හා පිටි සහ සීනි ශීර්ෂ යටතේ ලැබුන ආදායම අඩුවීමට හේතු වූයේ ආනයන පරිමාව අඩුවීම හා පසුව සඳහන් කළ ශීර්ෂ දෙක සඳහා ආහාර කොමසාරිස්වරයා විසින් බදු ගෙවීම පමා කිරීමය. 1964/65 මුදල් වර්ෂයේ රෙදිපිළි ආනයනය කලින් වර්ෂයේ ප්‍රමාණයෙන් අඩක් වූ බව මෙහිලා විශේෂයෙන් සඳහන් කළ යුතුව ඇත. මේ නියායෙන් ම ඉන්ධන හා දුම්කොළ බදු ආදායම් වැඩිවීමට ද හේතු වූයේ, ආනයන පරිමාව වැඩිවීමය. "අනෙකුත් භාණ්ඩ" ශීර්ෂය යටතේ ලැබුන බදු ප්‍රමාණය අඩුවීමට හේතු වූයේ ද මේ ශීර්ෂය යටතේ අපනයනය බොහෝ සෙයින් අඩුවීමය.

1964/65 ආදායම් බදු වලින් ලද ප්‍රමාණය, (අධිභාරය හැර) 1963/64 නියම වශයෙන් ලැබුන ප්‍රමාණය හා සසඳන විට රුපියල් කෝටි 0·99 කින් වැඩි විය. ආදායම් බදු ආදායම වැඩිවීමට පහත දැක්වෙන සාධක හේතු වූවා විය හැකිය. (අ) කලින් වර්ෂ වල දීට වඩා පුළුල් ලෙස විමර්ශන කාර්යයන් කිරීම හා එහි ප්‍රතිඵල වශයෙන් අළුතින් බදු ගෙවන්නන් විශාල සංඛ්‍යාවක් සොයා ගත හැකිවීම. (ආ) රුපියල් 25,000 ට වැඩි ආදායම් සඳහා බදු අනුපාතිකයන් වැඩි කිරීම. (ඇ) ප්‍රකාශිත බදු සමාව නිසා ලද ආදායම. පෞද්ගලික බදු වලින් ලැබුන ආදායම 1963/64 මුදල් වර්ෂයේ එමගින් ලැබුන ප්‍රමාණයට වඩා රුපියල් කෝටි 0·62 කින් වැඩි විය. 1964/65 මෙම වැඩිවීමට, ධන බද්ද වෙනුවට අනේවාසික සමාගම් වලින් වැඩි බදු අනුපාතිකයක් අය කිරීමත් පුද්ගලයන්ගෙන් අය කැරෙන ධන බදු අනුපාතිකය වැඩි කිරීමත් හේතු වූවා සේ සැලකිය හැකිය.

1964/65 මුදල් වර්ෂය තුළ දී කළුතෙල් රථ බද්ද හා පිරිවැටුම් බදු වශයෙන් ලැබුන ආදායම් කලින් වර්ෂයේ දීට වඩා පිළිවෙළින් රුපියල් කෝටි 2·74 කින් හා රුපියල් කෝටි 1·88 කින් වැඩි විය. කළුතෙල් මෝටර් රථ බදු ආදායම වැඩි වූයේ ලංගමයෙන් අයවිය යුතුව තිබුන හිඟ මුදල් ගෙවීමේ හේතුවෙනි. පිරිවැටුම් බදු ආදායම වැඩි වූයේ මුළු වර්ෂය සඳහා ම ආදායම් එකතුව ඇති බැවිනි. කලින් වර්ෂයේ ලැබුන ආදායම සමසක් සඳහා පමණක් විය.

පසුගිය මුදල් වර්ෂයේදීට වඩා තවත් අය මාර්ග දෙකකින් ලැබුන ආදායම වැඩි විය. මෙයට දුම්කොළ බද්ද සහ අරක්කු විකිණීමෙන් ලද ලාභය ඇතුළත් වෙයි. දුම්කොළ බද්දෙන් රුපියල් කෝටි 1·88 ක් වැඩිපුර ලබා ගැනීමට හැකි වූයේ, වේගයෙන් වැඩි වූ දේශීය ඉල්ලුම් සපුරාලීම සඳහා වැඩි වැඩියෙන් මෙරට

1. බලපත්‍ර යටතේ ගෙන්වනු ලබන භාණ්ඩ සඳහා වූ බලපත්‍ර ගාස්තු ඇතුළති.
2. භූමිතෙල් සඳහා වූ මේ ආනයන බද්ද 1965 අගෝස්තු මස 10 වැනි දින වලංගු කරන ලදී

දුම්කොළ පාවිච්චියට ගැනීම නිසා ය. 1959/60 සිට 1964/65 දක්වා වූ පස් අවුරුදු කාලය තුළ දුම්කොළ බද්දෙන් ලත් ආදායම වාර්ෂිකව සියයට 22·5 (සංයුක්ත) බැගින් වැඩිවීම සැලකිය යුතු කරුණෙකි. අරක්කු විකිණීමෙන් ලද ලාභය රුපියල් කෝටි 9·0 ක් වූයේ, 1963/64 ආදායමට බැර කළ ප්‍රමාණයට වඩා රුපියල් කෝටි 0·2 කින් වැඩි විය. මෙයින් ලැබුන ආදායම 1959/60 සිට 1964/65 දක්වා වූ පස් අවුරුදු කාලය තුළ වර්ෂයකට සියයට 3·4 (සංයුක්ත) බැගින් වැඩි වී ඇත.

**වියදම**

රජයේ වියදම්, 1959/60 සිට වාර්ෂිකව ගෙන වර්තන හා ප්‍රාග්ධන වියදම් වශයෙන් වර්ග කොට II (ඉ) 3 සංඛ්‍යා සටහනේ දක්වා ඇත. දැනට ලැබී ඇති තාවකාලික සංඛ්‍යා අනුව රජයේ මුළු වියදම 1964/65 දී රුපියල් කෝටි 231·13 ක් විය. මෙය 1963/64 මුළු වියදමට වඩා රුපියල් කෝටි 4·07 කින් වැඩි විය. 1963/64 මුදල් වර්ෂයෙන් අවසන් වූ දශකය තුළ වියදම් සාමාන්‍යය වසරකට සියයට 11·5 කින් වැඩි වූ අතර, 1964/65 වැඩිවීම සියයට 1·8 ක් විය.

1964/65 මුල් ඇස්තමේන්තු හා සසඳන කල, තාවකාලික වියදම් සංඛ්‍යා වලින් රුපියල් කෝටි 8·08 ක ඌන වියදමක් දැක්වේ. 1963/64 දක්නට ලැබුනු පිළිවෙලට වඩා වෙනස් වෙමින්, 1964/65 වර්තන වියදම් මෙන් ම ප්‍රාග්ධන වියදම් ද මුල් ඇස්තමේන්තු වලට වඩා අඩු විය. එහෙත් නියම (තාවකාලික) ප්‍රාග්ධන වියදම මුල් ඇස්තමේන්තු වලට වඩා සියයට 10·4 කින් පහළ වැටුන අතර, වර්තන වියදම පහළ වැටී ඇත්තේ සියයට 1 ටත් අඩු ප්‍රමාණයකිනි.

**සංඛ්‍යා සටහන II (ඉ) - 3**

**රජයේ වියදම්***

රුපියල් දශ ලක්ෂ

| වර්ෂය | වර්තන වියදම් | ප්‍රාග්ධන වියදම් | | | මුළු වියදම් |
|---|---|---|---|---|---|
| | | මූර්ත වත්කම් අත්කර ගැනීම, නිර්මාණය කිරීම හා පවත්වා ගෙන යාම | මූල්‍ය වත්කම් අත්කර ගැනීම | මුළු ප්‍රාග්ධන වියදම් | |
| 1959/60 .. | 1365·4 | 440·1 | 55·6 | 495·7 | 1861·1 |
| 1960/61 .. | 1471·3 | 471·9 | 47·2 | 519·1 | 1990·4 |
| 1961/62 .. | 1498·1 | 499·4 | 86·2 | 585·6 | 2083·7 |
| 1962/63 .. | 1534·0 | 479·1 | 9·9 | 489·0 | 2023·0 |
| 1963/64 .. | 1753·6 | 488·5 | 29·1 | 517·6 | 2271·2 |
| 1964/65 මුල් ඇස්තමේන්තු | 1745·1 | 626·6 | 21·0 | 647·6 | 2392·7 |
| නියම(තාවකාලික) | 1731·7 | 546·1 | 33·1 | 580·0 | 2311·9 |
| 1965/66 මුල් ඇස්තමේන්තු | 1762·8 | 635·9 | 32·1 | 668·0 | 2430·8 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

සැ. යු:- විස්තර හා සංඛ්‍යා ලබාගත් අයුරු දැන ගැනීමට දෙවෙනි පරිශිෂ්ටයෙහි 20 වැනි සංඛ්‍යා සටහන බලන්න.

* මෙම සංඛ්‍යා සටහන, අත්තිකාරම් ගිණුම් ගනුදෙනු වෙනුවෙන් වූ ලැබීම් හෝ ගෙවීම්ද ඇතුළත් නොවන, 2 වැනි පරිශිෂ්ටයේ 20 වැනි සංඛ්‍යා සටහනෙහි ගෙවීම් අංශය පිළිබඳ සම්පිණ්ඩණයකි. සංඛ්‍යා සටහනේ දැක්වෙන, මුළු වියදම් පිළිබඳ සංඛ්‍යා II (ඉ) 1 සංඛ්‍යා සටහනෙහි දැක්වෙන වියදම් සංඛ්‍යාවලට වඩා වෙනස් වේ. මෙයින් මුල් එකට අතිරේක අයවැය අරමුදල් සඳහා වූ පැහැදම් ඇතුලත් වන අතර අත්තිකාරම් ගිණුම් ගනුදෙනු වෙනුවෙන් වූ වියදම් ඇතුළත් නොවේ. ඒවා මුළු වැය සම්මතය පිළිබඳ සංඛ්‍යාවලින් ද වෙනස්වනුයේ නිදන් අරමුදල් දයක දීමනා හා ආදයමෙන් කැරුන රාජ්‍ය ණය ආපසු ගෙවීම් (අවක්‍ර) හා පොත් ගැලපිලි ඇතුළත් නොකළ නමුදු අතිරේක අයවැය අරමුදල්වල පැහැදම් ඇතුළත් කර ඇති බැවිනි.

## වර්තන වියදම

II (ඉ) 3 සංඛ්‍යා සටහන අනුව, 1964/65 වර්තන වියදම (තාවකාලික සංඛ්‍යා) 1963/64 වර්තන වියදමට වඩා රුපියල් කෝටි 2·17 කින් අඩු වී ඇත. මෙය, 1954/55 මුදල් වර්ෂයේ සිට වර්තන වියදමෙහි ඇති වූ වැඩිවීමේ හැඩගැස්ම අංපසු හැරවීමෙකි. 1963/64 සිට 1965/66 දක්වා වූ මුදල් වර්ෂ වල වර්තන වියදම් සංසන්දනය සඳහා තරමක් සවිස්තරව II (ඉ) 4 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

### සංඛ්‍යා සටහන II (ඉ) – 4

### වර්තන වියදම් 1963/64 සිට 1965/66

රුපියල් දශ ලක්ෂ

| | නියම 1963/64 | නියම (තාවකාලික) 1964/65 | මුල් ඇස්තමේන්තු 1964/65 | මුල් ඇස්තමේන්තු 1965/66 |
|---|---|---|---|---|
| 1· ආහාර සහනාධාරය .. .. .. | 375·4* | 290·0* | 327·0* | 271·5* |
| 2· අධ්‍යාපනය .. .. .. | 309·3 | 329·0 | 315·9 | 334·5 |
| 3· සෞඛ්‍යය .. .. .. | 147·8 | 153·5 | 152·5 | 159·0 |
| 4· රාජ්‍ය ණය පොළී .. .. .. | 113·7 | 105·9 | 100·4 | 114·9 |
| 5· විශ්‍රාම වැටුප් .. .. .. | 130·2 | 143·3 | 135·8 | 145·9 |
| 6· රජයේ ව්‍යවසායන් † .. .. .. | 234·1 | 246·9 | 254·5 | 256·4 |
| 7· එකතුව (ශීර්ෂ 1–6) .. .. .. | 1,310·5 | 1,268·6 | 1,286·1 | 1,282·2 |
| 8· මුළු වර්තන වියදම .. .. .. | 1,753·6 | 1,731·9 | 1,745·1 | 1,762·8 |
| 9· 7, 8 හි සියයට ගණන වශයෙන්.. .. | 74·7 | 73 2 | 73·7 | 72·7 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

* මේ සංඛ්‍යා භාණ්ඩාගාර ලෙජරයන්හි දී ඇත

† දුම්රිය, විදුලිය, තැපැල් හා විදුලි සන්දේශ හා ගුවන් විදුලි යන දෙපාර්තමේන්තුවල හා වරාය කොමිසමේ වර්තන ගෙවීම් ඇතුළත් වෙයි.

1963/64 හා සසඳන විට, 1964/65 වර්තන ගිණුම් වියදම අඩු වුයේ රජයේ සංක්‍රාම ගෙවුම් අඩු වීමෙනි. සංක්‍රාම ගෙවුම් අඩුවීමට හේතු වී ඇත්තේ ආහාර සහනාධාර වියදම් අඩුවීම හා රාජ්‍ය ණය සඳහා වූ පොළී වලින් ඉතිරියක් ඇතිවීමය. එද දෙ වැනි පරිශිෂ්ටයේ 20 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වෙන පරිදි අඩු වූ ආවර්තන වියදමෙන් කොටසක්, අධ්‍යාපනය හා සෞඛ්‍ය, කෘෂිකර්මය හා වාරිමාර්ග සහ පරිපාලනය හා රාජ්‍යාරක්ෂාව සඳහා වූ වර්තන වියදම් වැඩිවීමෙන් මැකීගියේය.

1963/64 හා සමයන කල, 1964/65 ආහාර සහනාධාරය (ශුඩ) අඩුවීමට හේතු වූ කරුණු කවරේදැයි සොයා බැලීම වටනේය. උචිත සංඛ්‍යා II (ඉ) 5 සංඛ්‍යා සටහනේ දී ඇත.

### සංඛ්‍යා සටහන II (ඉ) – 5

### 1963/64 සිට 1965/66 දක්වා ආහාර සහනාධාර වියදම

රුපියල් දශ ලක්ෂ

| | 1963/64 | 1964/65 (තාවකාලික) | 1965/66 මුල් ඇස්තමේන්තු |
|---|---|---|---|
| 1. ආනයන කළ සහල් වෙනුවෙන් පාරිභෝජකයාට ආධාර .. | 193·3 | 180·0 | 186·6 |
| 2. මෙරට නිපැදවූ සහල් වෙනුවෙන් නිෂ්පාදකයාට හා පාරිභෝජකයාට ආධාර .. | 285·6 | 246·4 | 258·1 |
| 3. මෙරට නිෂ්පාදිත රතුළූනු සඳහා ආධාර .. | 1·6 | 2·5 | 1·5 |
| 4. බෙදා හැරීමේ වියදම් හා අනෙකුත් ගාස්තු .. | 27·6 | 34·5 | 32·2 |
| 5, දළ ආධාර එකතුව (1 සිට 4) .. | 454·0 | 463·4 | 478·4 |
| 6. සීනි විකිණීමෙන් ලාභ .. | 73·4 | 173·0 | 195·3 |
| 7. පිටි විකිණීමෙන් ලාභ .. | 1·2 | 0·6 | 2·1 |
| 8. අනෙකුත් භාණ්ඩ විකිණීමෙන් ලාභ .. | 9·8 | 11·8 | 9·6 |
| 9. එකතුව (6 සිට 8) .. | 84·4 | 184·2 | 207·0 |
| 10, ආහාර ආධාර (ශුද්ධ) (5 – 9) .. | 369·6 | 279·2 | 271 5 |

සංලක්ෂ්‍යය: මෙම සටහනේ ආහාර ආධාර (ශුද්ධ) සංඛ්‍යාවන් II (ඉ) 4 සංඛ්‍යා සටහනේ සංඛ්‍යාවලට වෙනස්වේ. ඊට හේතුව භාණ්ඩාගාරය හා ආහාර කොමසාරිස්වරයා විසින් අනුගමනය කරනු ලබන ගිණුම් ක්‍රමයන්හි වෙනස් වීමය.

ආනයන කළ සහල් සහනාධාරය වැඩි වූයේ බුරුමය, චීනය හා තායිලන්ත යෙන් ආනයන කළ සහල් ගොඩබාන විට වූ මිල වැඩිවීමෙනි. ආනයන කළ සහල් අලෙවිය ද 1963/64 දීට වඩා 1964/65 දී ටොන් 95,420 කින් වැඩි විය. මෙරට සහල් නිෂ්පාදනය හා පාරිභෝජනය සඳහා දුන් සහනාධාර අඩුවීමට හේතු වූයේ, ගොවිජන සේවා කොමසාරිස්වරයා ගෙන් මිලට ගෙන පසුව පාරිභෝගිකයාට විකුණූ සහල් ප්‍රමාණය අඩුවීම නිසාවෙනි. 1964/65 දී මෙරට නිපදවා විකුණූ සහල් ප්‍රමාණය 1963/64 දී ට වඩා ටොන් 66,787 කින් අඩු විය. මේ අනුව, 1964/65 සහනාධාර (දළ) 1963/64 දීට වඩා වැඩි වූයේ රුපියල් කෝටි 0·94 කින් පමණි. මේ අනුව 1964/65 දී සහනාධාර (ශුඩ) අඩු වී ඇත්තේ සීනි විකිණීමෙන් ලැබුන ලාභය සැලකිය යුතු අන්දමින් වැඩිවීමෙනි. සීනි විකිණීමෙන් විශාල ලාභයක් ලබාගත හැකි වූයේ, සීනි ගොඩබෑමේ දී වූ මිල 1963/64 දීට වඩා අඩුවීමත්, පාරිභෝගිකයාට සීනි විකුණූ මිල පසුගිය දෙවසර තුළ ම නොවෙනස්ව පැවතීමත් නිසා ය.

ජනගහනය වැඩිවීම හා එහි ඵල විසින් පාසල් සංඛ්‍යාව වැඩි වන පරිසරයක සෞඛ්‍ය හා අධ්‍යාපනය වෙනුවෙන් වියදම වැඩිවීම බලාපොරොත්තු විය යුත්තකි.

රාජ්‍ය ණය සඳහා පොලී වශයෙන් අඩු මුදලක් වැය වී ඇත්තේ ප්‍රධාන වශයෙන් ම, මහ බැංකුව භාණ්ඩාගාර බිල්පත් මිලට ගැනීමේ දී ලත් වට්ටම් අනුපාතිකය (සියයට 0·76) 1964 අගෝස්තු 1 වැනි දින සිට අඩුවීමේ හේතුවෙනි.

**ප්‍රාග්ධන වියදම**

II (ඉ) - 3 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇති පරිදි, 1964/65 ප්‍රාග්ධන වියදම රුපියල් කෝටි 58·0 ක් (තාවකාලික) විය මේ සංඛ්‍යාවට රජයේ ඇස්තමේන්තුවල 3,5 හා 7 වැය සම්මතවල මුළු එකතුව ද, 1,2,4 හා 6 වැය සම්මතවලට ඇතුළත් ප්‍රාග්ධන ස්වරූපීය වියදම් සහ තේ හා රබර් නැවත වගා කිරීමේ ආධාර අරමුදල් ආදී අතිරේක අරමුදල් වලින් කැරෙන අය වැය වියදම්ද ඇතුළත් වේ. මෙනයින් විග්‍රහ කැරුන ප්‍රාග්ධන වියදමෙහි මුළු එකතුව 1963/64 අනුරූප සංඛ්‍යාවට වඩා රුපියල් කෝටි 6·24 කින් වැඩිවිය. ප්‍රාග්ධන වියදම වැඩිවී ඇත්තේ ප්‍රධාන වශයෙන්ම මූර්ත වත්කම් අත්කර ගැනීම, නිර්මානය හා නඩත්තු කිරීම සඳහාය. 1964/65 දී අත්කර ගත් මූල්‍ය වත්කම්වල වටිනාකම 1963/64 දීට වඩා රුපියල් කෝටි 0·40 කින් වැඩිවිය.

ප්‍රාග්ධන වියදම තවදුරටත් වර්ග කර බලන විට, වියදම් වැඩිවී ඇත්තේ ආර්ථික සේවා රුපියල් කෝටි 5·04) හා රජයේ ව්‍යවසායන් (රුපියල් කෝටි 1·49) නිසා බව පෙනීයයි. ආර්ථික සේවා ගණය යටතේ කෘෂිකර්මය, වාරිමාර්ග හා ධීවර කටයුතු සඳහා වූ වියදම රුපියල් කෝටි1·93 කින් ද, නිෂ්පාදනය හා පතල් කර්මාන්තය සඳහා වූ වියදම රුපියල් කෝටි 2·55 කින්ද, ගමනා ගමනය සඳහා වියදම් රුපියල් කෝටි 0·48 කින්ද වැඩිවිය. එහෙත් සමාජ සේවා හා පරිපාලන වියදම් පිළිවෙළින් රුපියල් කෝටි 0·62 කින් හා රුපියල් කෝටි 0·07 කින් අඩු විය. සමාජ සේවා ගණය තුළ අධ්‍යාපන හා සෞඛ්‍ය කටයුතු සඳහා වූ වියදමෙහි පහළ වැටීමෙක් දක්නට ලැබින.

**අත්තිකාරම් ගිනුම් ගනුදෙනු**

1964/65 දී අත්තිකාරම් ගිණුම් ගනුදෙනු වලින් රුපියල් කෝටි 1·24 ක ශුද්ධ ලැබීමක් ඇතිවිය. 1963/64 දී අනුරූප වැඩිවීම රුපියල් කෝටි 1·61ක් විය. දනට ඇති සංඛ්‍යා තොරතුරු අනුව මෙකී ගිණුම් පිළිබඳ විස්තර සැපැයිය නොහැක. මෙකී ලැබීමට (ශුද්ධ) ප්‍රධාන වශයෙන් හේතු වූයේ, රජයේ දෙපාර්තමේන්තුවලට අත්තිකාරම් වශයෙන් දෙන ලද රුපියල් කෝටි 8·24 ක් ආපසු ගෙවීමය. චීනයත් සමග වූ රබර්/සහල් ගිවිසුම යටතේ ලංකාවට අය වූ රුපියල් කෝටි 7·04 ක ශේෂයකින් මෙය මඳක් මැකී ගියේය.

## ශුද්ධ අය-වැය හිඟය

1964/65 ශුද්ධ අය වැය හිඟය රුපියල් කෝටි 44·25 ක් විය. මෙය, ඉකුත් මුදල් වර්ෂයේ ශුද්ධ අය වැය හිඟයට වඩා රුපියල් කෝටි 1·92 කින් අඩුය. මෙයට හේතු වූයේ ආවර්තන වියදම රුපියල් කෝටි 3·05 කින් පහළ වැටීම හා ආදායම රුපියල් කෝටි 5·74 කින් වැඩිවීමය. එහෙත් ප්‍රාග්ධන වියදම රුපියල් කෝටි 6·52 කින් වැඩි වීමෙන් හා අත්තිකාරම් ගිණුම් ගනුදෙනු වලින් වූ ලැබීම් රුපියල් කෝටි 0·37 කින් පහළ වැටීමෙන් එය මැකී ගියේය.

1964/65 නියම (ශුද්ධ) අයවැය හිඟය මුල් ඇස්තමේන්තුවට වඩා රුපියල් කෝටි 5·83 කින් අඩුවිය. මේ සිදුවූයේ සම්මත මුළු වියදම රුපියල් කෝටි 5·08 කින් අඩුවීමත්, අත්තිකාරම් ගිණුම් ගනුදෙනු වලින් රුපියල් කෝටි 1·24 ක (ශුද්ධ) ලැබීමක් ඇතිවීමත් හා ලැබුන ආදායම රුපියල් කෝටි 0·49 කින්[1] අඩුවීමේ ඒකාබද්ධ බලපෑම හේතුකොටගෙනය. මෙය 1963/64 මුදල් වර්ෂයේ ඇතිවූ හැඩගැස්මට වඩා වෙනස් විය. පසුගිය වසරේ, නියම (ශුද්ධ) අයවැය හිඟය මුල් ඇස්තමේන්තුවට වඩා රුපියල් කෝටි 4·37 කින් වැඩිවිය. 1964/65 මුල් ඇස්තමේන්තුවට වඩා එම වර්ෂයේ සම්මත මුළු වියදම අඩුවූයේ, ආවර්තන වියදමෙහි රුපියල් කෝටි 3·95 ක[2] ඌන ඇස්තමේන්තුවකින් තරමක් දුරට මැකී ගියද ප්‍රාග්ධන වියදම රුපියල් කෝටි 9·03 කින් අඩුවීම හේතුකොට ගෙනය

## හිඟය පියවීම

ශුද්ධ අයවැය හිඟය පියැවුන ආකාරය හා එහි ප්‍රාසාරණාත්මක බලපෑම් ඉකුත් මුදල් වර්ෂයේ අනුරූප සංඛ්‍යා තොරතුරු සමග II (ඉ) 6 වැනි සංඛ්‍යා සටහනේ දැක්වේ.

### සංඛ්‍යා සටහන II (ඉ) 6

### හිඟය පියවූ ආකාර

රුපියල් දශ ලක්ෂ

| | 1963/64 | | | 1964/65 (තාවකාලිකයි) | | |
|---|---|---|---|---|---|---|
| 1. පරිපාලන ණය ගැනීම .. | | | —1·9 | | | 56·7 |
| 2. විදේශ මුදල් .. | | | | | | |
| (අ) ණයට ගත් .. | | | | | | |
| (i) ණයට ගත් ප්‍රමාණය (දළ) .. | 75·7 | | | 92·8 | | |
| (ii) නැවත ගෙවීම් හා නිදන් අරමුදල් දයක දීමනා හැර .. | 12·2 | 63·5 | | 17·2 | 75·6 | |
| (ආ) දීමනා .. | | 31·9 | 95·4 | | 24·5 | 100·1 |
| 3. බැංකු නොවන, දේශීය වෙළෙඳ පොළෙන් ගත් ණය .. | | | | | | |
| (අ) ණයටගත් ප්‍රමාණය දළ වශයෙන් .. | | 252·2 | | | 294·4 | |
| (ආ) නිදන් අරමුදල් හැර .. | | 44·6 | 207·6 | | 51·2 | 243·2 |
| 4. දේශීය වෙළෙඳ පොළේ බැංකු ක්‍රමයෙන් ගත් ණය .. | | | 115·2 | | | 17·7 |
| 5. රජයේ මුදල් ශේෂ අඩුවීම .. | | | | | | |
| ( – ලකුණ වැඩිවීමෙක් දක්වයි) | | | 45·4 | | | 24·8 |
| 6. ශුද්ධ අය-වැය හිඟය .. | | | 461·7 | | | 442·5 |
| 7. එක්සත් ජනපදයේ ප්‍රතිපාර්ශ්වීය අරමුදල් අඩුවීම .. | | | | | | |
| ( – ලකුණ වැඩිවීමෙක් දක්වයි) | | | 2·3 | | | —2·5 |
| 8. රජයේ මුදල් ගනුදෙනුවල ශුද්ධ ප්‍රාසාරණාත්මක බලපෑම (4+5+7) .. | | | 162·9 | | | 40·0 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

1. ඇස්තමේන්තු (මුල්) ආදයම වන රුපියල් කෝටි 182·13 ට, 1964/65 අයවැය කතාවේ සඳහන් නො වූ මාර්ගවලින් ලද රුපියල් කෝටි 6·01 ආදයම ඇතුළත් නොවේ.
2. 1964/65 මුල් අයවැය ඇස්තමේන්තුවල ආවර්තන වැය ශීර්ෂයන්හි ඌන වියදම් සඳහා රුපියල් කෝටි 4·70 කට ඉඩ හැරීමෙන් පසුවය.

1964/65 වර්ෂයේ මුදල් ගනුදෙනු හේතුකොට ගෙන ඇතිවූ රුපියල් කෝටි 44·25 ක ශුද්ධ අයවැය හිඟය, බැංකු නොවන දේශීය මාර්ග වලින් රුපියල් කෝටි 24·32 ක්ද, විදේශාධාර වලින් රුපියල් කෝටි 10·01 ක්ද, මුදල් ශේෂ අඩු කිරීමෙන් රුපියල් කෝටි 2·48 ක්ද, පරිපාලන ණය ගැනීම් වලින් රුපියල් කෝටි 5·67 ක්ද, බැංකු ක්‍රමයෙන් රුපියල් කෝටි 1·77 ක්ද ලබා ගෙන පියවන ලදී.

ඉහත සඳහන් හේතුන් නිසා, 1964/65 නියම ශුද්ධ අයවැය හිඟය කලින් වර්ෂය හා සමයන කල, රුපියල් කෝටි 1·92 කින් අඩුවී ඇත. එහෙත් 1964/65 අයවැය හිඟයේ[1] ප්‍රාසාරණාත්මක බලපෑම ශුද්ධ අයවැය හිඟයෙහි අඩුවීමට වඩා ඉතා සැලකිය යුතු ලෙසඅ ඩුවූ බව මෙහිලා සැලකිය යුතුය. 1964/65 රජයේ මුදල් ගනුදෙනු නිසා ඇතිවූ ප්‍රාසාරණාත්මක බලපෑම රුපියල් කෝටි 4·0 ක් වූයේ 1963/64 අනුරූප සංඛ්‍යාවට වඩා රුපියල් කෝටි 12·29 ක අඩුවීමෙක් සටහන් විය. මේ බැංකු නොවන දේශීය මාර්ගවලින් (රුපියල් කෝටි 3·56) හා පරිපාලන මාර්ගවලින් (රුපියල් කෝටි 5·86) වැඩියෙන් ණය ලබා ගැනීමෙන් ඇති වූවකි. මේ මගින් බැංකු ක්‍රමයෙන් ණය ගැනීම රුපියල් කෝටි 9·75කින්ද මුදල් ශේෂ උපයෝගි කර ගැනීම රුපියල් කෝටි 2·06 කින්ද අඩුකර ගැනීමට රජයට පිළිවන් විය.

බැංකු ක්‍රමයෙන් ගත් රුපියල් කෝටි 1·77 මුළුමනින්ම ලබා ගත්තේ වෙළෙඳ බැංකු වලිනි. රජය බැංකු ක්‍රමයෙන් ණය ගැනීම අඩුවනු වස් මහ බැංකුව විසින් දරන ලද තැත. මෙහිදී සැලකිල්ලට ගත යුතුය. රජය මහ බැංකුවෙන් ලබාගත් ණය (ශුද්ධ) රුපියල් කෝටි 3·95 කින් අඩුවිය. මෙසේ එය අඩුකර ගනු ලැබුයේ රුපියල් කෝටි 4·67 ක භාණ්ඩාගාර බිල්පත් හා රුපියල් කෝටි 0·11 ක රජයේ සුරැකුම් පත් විකිණීමෙනි. රජයට, මහ බැංකුවෙන් දෙන ලද අත්තිකාරම් රුපියල් කෝටි 0·83 කින් වැඩි වීමෙන් මෙය තරමක් මැකී ගියේය. වෙළෙඳ බැංකු වලින් ගත් ණය වැඩි වූයේ, (රුපියල් කෝටි 5·72) බැංකු සතු භාණ්ඩාගාර බිල්පත් (රුපියල් කෝටි 5·85) හා බදු සංචිත සහතික (රුපියල් කෝටි 0·11) කින් වැඩිවීමෙනි. එහෙත් බැංකු සතු රජයේ සුරැකුම් පත් රුපියල් කෝටි 0·24 කින් අඩුවීම නිසා මෙය තරමකට මැකී ගියේය.

1964/65 දී බැංකු නොවන මාර්ග වලින් ගත් ණය ප්‍රමාණය රුපියල් කෝටි 24·32 ක් වූයේ, 1963/64 එකී මාර්ග වලින් ගත් ප්‍රමාණයට (රුපියල් කෝටි 20·76 ට) වඩා වැඩි විය. එය 1962/63 දී බැංකු නොවන මාර්ග වලින් ලබාගත් ණය ප්‍රමාණයට ද (රුපියල් කෝටි 15·35) ඉක්මවා ගියේය. බැංකු නොවන මාර්ග වලින් ලබා ගැනීමට හැකි ණය වැඩි වන අතට හැරෙමින් පවතී. 1959/60 සිට 1964/65 තෙක් වූ පස් අවුරුදු කාලය තුළ මෙරට බැංකු නොවන අංශයෙන් ලැබුන ණය සාමාන්‍යයෙන් වාර්ෂිකව රු. කෝටි 3·18 කින් වැඩි වී ඇත. රජයේ අයවැය හිඟයන් පියවීම සඳහා පසුගිය තෙවස තුළ මෙම අංශය දයක වී ඇති අයුරු වඩාත් වැදගත් වෙයි. 1961/62 හා 1964/65 යන මුදල් වර්ෂ තුළ දී මෙරට බැංකු නොවන අංශයෙන් ගත් ණය ප්‍රමාණය රුපියල් කෝටි 10·94 සිට රුපියල් කෝටි 24·32 දක්වා වැඩි විය. මෙය, රුපියල් කෝටි 4·46 ක සාමාන්‍ය වාර්ෂික වැඩිවීමෙකි.

---

1, එක්සත් ජනපද ප්‍රතිපාර්ශ්වීය ආධාර අරමුදල්හි වෙනස්වීම් සඳහා ගැලපූ කල.

ඉතිරි කිරීම් ආයතන, සේවක අර්ථසාධක අරමුදල, රක්‍ෂණ සංස්ථාව, දෙපාර්තමේන්තු අරමුදල් හා අනෙකුත් අර්ථසාධක අරමුදල් සිය දායක දීමනා වැඩි කිරීමෙන් 1964/65 දී ලැබුන මුළු ප්‍රමාණය වැඩිකළහ. 1964/65 දී ප්‍රධාන ආයෝජක ගණයන් විසින් රජයේ සුරැකුම් පත්වලට (භාණ්ඩාගාර බිල්පත් හා බදු සංචිත සහතික ඇතුළුව) කැරුන දායක දීමනා, ඉකුත් මුදල් වර්ෂ තුනේ අනුරූප සංඛ්‍යා තොරතුරු සමග II (ඉ) 7 සංඛ්‍යා සටහනේ දක්වා ඇත.

### සංඛ්‍යා සටහන II (ඉ) 7

### බැංකු නොවන ප්‍රධාන ආයෝජන ගණ විසින් රජයේ සුරැකුම් පත් වෙනුවෙන් කැරුන දායක දීමනා

රුපියල් දශ ලක්ෂ

| | 1961/62 | 1962/63 | 1963/64 | 1964/65 | 1964/65 ට වඩා 1963/64 වෙනස |
|---|---|---|---|---|---|
| 1. ඉතිරි කිරීම් ආයතන .. | 12·5 | 14·3 | 28·9 | 37·9 | 9·0 |
| 2. සේවක අර්ථසාධක අරමුදල .. | 59·4 | 61·7 | 65·6 | 70·0 | 4·4 |
| 3. රක්ෂණ සංස්ථාව .. | — | 16·4 | 29·0 | 42·2 | 13·2 |
| 4. අනෙකුත් රජයේ සමායතන .. | — | — | 3·5 | — | -3·5 |
| 5 දෙපාර්තමේන්තු හා අනෙකුත් කාර්යාලීය අරමුදල් .. | 3·1 | 6·5 | 9·6 | 13·8 | 4·2 |
| 6. අනෙකුත් අර්ථසාධක හා විශ්‍රාම වැටුප් අරමුදල් .. | 25·0 | 31·2 | 22·0 | 28·4 | 6·4 |
| 7. අනෙකුත් රක්‍ෂණ අරමුදල් .. | 10·1 | 6·0 | 7·6 | 3·4 | -4·2 |
| 8. සමාගම්, සමාජ, ආයතන හා පුද්ගලයන් .. | —7·1 | 5·2 | 13·5 | 0·6 | -12·9 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

### විදේශීය මුදල්

1964/65 දී ප්‍රාග්ධන වියදම සඳහා ලැබුන විදේශීය ආධාර රුපියල් කෝටි 11·73 ක් විය. 1963/64 දී රුපියල් කෝටි 10·75 ක් ද, 1962/63 දී රුපියල් කෝටි 9·98 ක්ද, 1961/62 දී රුපියල් කෝටි 6·26 ක්ද, 1960/61 දී රුපියල් කෝටි 2·96 ක්ද මේ සම්බන්ධයෙන් ලැබී ඇත. මේ පස්වසර තුළ ගෙවන ලද විදේශීය ණය, 1964/65 දී රුපියල් කෝටි 1·57 ක්ද, 1963/64 දී රුපියල් කෝටි 1·07 ක්ද, 1962/63 දී රුපියල් කෝටි 0·63 ක්ද, 1961/62 දී රුපියල් කෝටි 0·68 ක්ද, 1960/61 දී රුපියල් කෝටි 0·3 ක්ද, විය.

විදේශාධාර, වර්ගය හා ලැබුනු මාර්ගය අනුව වර්ග කොට, II (ඉ) 8 සංඛ්‍යා සටහනෙහි සවිස්තරව දක්වා ඇත. විදේශීය ණය හා දීමනා වලින් ලත් ශුද්ධ ලැබීම් රුපියල් කෝටි 0·62 කින් වැඩි විය. එහෙත් මුලින් බලාපොරොත්තු වූ ප්‍රමාණයත් නියම වශයෙන් ලැබුණු ප්‍රමාණයත් අතර සැලකිය යුතු වෙනසක් දක්නට ලැබේ.[1]

### සංඛ්‍යා සටහන II (ඉ) 8

### ප්‍රාග්ධන වියදම් සඳහා ලැබුණු විදේශාධාර

රුපියල් දශ ලක්ෂ

| | 1960/61 ලැබීම් (ශුද්ධ) | 1961/62 ලැබීම් (ශුද්ධ) | 1962/63 ලැබීම් (ශුද්ධ) | 1963/64 ලැබීම් (ශුද්ධ) | 1964/65 ලැබුණු ප්‍රමාණය | 1964/65 ගෙවන ලද ප්‍රමාණය | 1964/65 ලැබීම් (ශුද්ධ) |
|---|---|---|---|---|---|---|---|
| **ණය** | | | | | | | |
| 1. ජා. ප්‍ර. ස. බැංකුව .. | 9·2 | 25·6 | 21·2 | 11·3 | 11·6 | 6·6 | 5·0 |
| 2. කැනඩාව .. | — | – 1·3 | 0·8 | – 0·2 | 12·7 | 1·3 | 11·4 |
| 3. චීනය .. | — | – 1·0 | — | 12·4 | 18·9 | — | 18·9 |
| 4. එක්සත් රාජධානිය .. | — | 3·3 | 11·9 | 6·4 | 3·3 | 4·1 | – 0·8 |
| 5. ඇ. එ. ජ. .. | 2·4 | 7·6 | – 0·7 | 2·7 | — | 1·2 | – 1·2 |
| 6. සෝ. ස. ස, සංගමය .. | 1·8 | 3·4 | 13·5 | 32·0 | 29·2 | 0·4 | 28·8 |
| 7. බටහිර ජර්මනිය .. | — | — | 11·5 | 0·4 | 8·6 | 1·2 | 7·4 |
| 8. යුගෝස්ලෝවියාව .. | — | — | 4·3 | ... | 0·4 | 0·7 | – 0·3 |
| 9. පෝලන්තය .. | | | | | 2·7 | 0·3 | 2·4 |
| 10. ප්‍රංශය .. | | | | | 5·5 | — | 5·5 |
| **දීමනා** | | | | | | | |
| කොළඹක්‍රමය | | | | | | | |
| 1. ඕස්ට්‍රේලියාව .. | 3·8 | — | 2·5 | — | 3·7 | | 3·7 |
| 2. කැනඩාව .. | 4·2 | 4·4 | 5·7 | 5·7 | 5·6 | | 5·6 |
| 3. ජපානය .. | — | — | — | 0·3 | — | | — |
| **අනෙකුත්** | | | | | | | |
| 1. චීනය .. | — | 8·3 | 19·7 | 24·5 | 15·1 | | 15·1 |
| 2. ඇ. එ. ජ .. | 5·3 | 1·6 | 0·9 | 1·4 | ... | | ... |
| 3. බටහිර ජර්මනිය .. | — | 3·8 | 2·3 | — | — | | — |
| **මුළු ණය සහ දීමනා** | 26·6 | 55·8 | 93·5 | 96·8 | 117·3 | 15·7 | 101·6 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි,

## රාජ්‍ය ණය

දේශීය හා විදේශීය රාජ්‍ය ණය පිළිබඳ සංඛ්‍යා තොරතුරු දෙ වැනි පරිශිෂ්ටයේ 24 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. පසුගිය මුදල් වර්ෂ පහේ එක් එක් වර්ෂයේ අවසානයට තිබූ දේශීය හා විදේශීය මුළු රාජ්‍ය ණය පිළිබඳ සංඛ්‍යා II (ඉ) 9 වැනි සංඛ්‍යා සටහනෙහි දැක්වේ.

### සංඛ්‍යා සටහන II (ඉ) 9

### මුළු රාජ්‍ය ණය *

රුපියල් දශ ලක්ෂ

| සැප්තැම්බර් අවසානයට | දළ ණය: මුළු දළ ණය | දළ ණය: පසුගිය මුදල් වර්ෂයට වඩා වැඩිවීම | ශුද්ධ ණය: ශුද්ධණය (නිදන් අරමුදල් වටිනාකම හැර) | ශුද්ධ ණය: පසුගිය මුදල් වර්ෂයව වඩා වැඩිවීම |
|---|---|---|---|---|
| 1961 .. .. .. | 2,651·0 | 420·6 | 2,332·7 | 419·9 |
| 1962 .. .. .. | 3,038·9 | 387·9 | 2,688·9 | 356·2 |
| 1963 .. .. .. | 3,437·3 | 398·4 | 3,065·4 | 376·5 |
| 1964 .. .. .. | 3,787·4 | 350·1 | 3,436·0 | 370·6 |
| 1965 .. .. .. | 4,184·8 | 397·4 | 3,771·9 | 335·9 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

* මේ රාජ්‍ය ණය සංඛ්‍යාවලට 1965 සැප්තැම්බර් අවසානය වන විට තිබූ රුපියල් කෝටි 7·5 ක ජාතික නිවාස ණයකර සහ රුපියල් කෝටි 3·33 ක රජයේ උකස් බැංකු ණයකර ද ඇතුළත් නොවේ.

1. 1964/65 අය වැය කතාවේ දී යෝජිත අයවැය හිඟය පියවනු වස් විදේශාධාර වලින් රුපියල් කෝටි 22·5 ක් අපේක්ෂා කැරිණි.

1964/65 මුදල් වර්ෂයේ දී දළ ණය රුපියල් කෝටි 39·74 කින් ද, ශුද්ධ ණය රුපියල් කෝටි 33·59 කින් ද ව ඩි විය. ඉකුත් මුදල් වර්ෂයේදී මේ ණය පිළිවෙළින් රුපියල් කෝටි 35·01 කින් හා රුපියල් කෝටි 37·06 කින් වැඩි විය. 1964/65 මුදල් වර්ෂයේ දී ශුද්ධ රාජ්‍ය ණය වැඩි වුවද, එය පසුගිය මුදල් වර්ෂ හතර තුළ දක්නට ලැබුන අඩුම වැඩිවීම විය.

රුපියල් කෝටි 39·74 කින් වැඩිවූ දළ ණය, රුපියල් සුරැකුම් පත් රුපියල් කෝටි 24·02 කින් ද, විදේශීය ණය රුපියල් කෝටි 7·72 කින් ද, භාණ්ඩාගාර බිල්පත් රුපියල් කෝටි 5·0 කින් ද, මහ බැංකු අත්තිකාරම් රුපියල් කෝටි 2·98 කින්ද, බදු සංචිත සහතික රුපියල් කෝටි 0·02 කින් ද වැඩිවීමෙන් සමන්විත විය.

**දේශීය ණය**

1964 සැප්තැම්බර් 30 වැනි දිනට රුපියල් කෝටි 337·53 ක් වූ දළ දේශීය ණය 1964/65 මුදල් වර්ෂය අවසන් වන විට රුපියල් කෝටි 32·02 කින් රුපියල් කෝටි 369·55 දක්වා වැඩි විය. එදිනට මේ ණය සැකැසී තිබුනේ මෙසේය: රුපියල් සුරැකුම්පත් රුපියල් කෝටි 214·95, භාණ්ඩාගාර බිල්පත් රුපියල් කෝටි 130·0, බදු සංචිත සහතික රුපියල් කෝටි 4·27, මහ බැංකු අත්තිකාරම් රුපියල් කෝටි 21·31, ජාතික සංවර්ධන පිළිනපත් රුපියල් කෝටි 0·01. 1963/64 හා 1964/65 මුදල් වර්ෂ වල දේශීය රාජ්‍ය ණය සැකැසීම සම්බන්ධයෙන් වූ සංඛ්‍යා තොරතුරු II (ඉ) 10 සංඛ්‍යා සටහනෙහි දැක්වේ.

### සංඛ්‍යා සටහන II (ඉ) 10

### දේශීය රාජ්‍ය ණය සැකසුම

රුපියල් දශ ලක්ෂ

| සැප්තැම්බර් අවසානයේදී | රුපියල් ණය | | | භාණ්ඩාගාර බිල්පත් | බදු සංචිත බිල්පත් | මහ බැංකු අත්තිකාරම (2) | ජාතික සංවර්ධන පිළිනපත් (3) | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | දළ | නිදන් අරමුදල්(1) | ශුද්ධ | | | | | දළ | ශුද්ධ |
| 1964 | 1909·4 | 312·8 | 1596·6 | 1250·0 | 32·5 | 183·3 | 0·1 | 3375·3 | 3062·5 |
| 1965 | 2149·6 | 370·2 | 1779·5 | 1300·0 | 32·7 | 213·1 | 0·1 | 3695·3 | 3325·3 |
| වෙනස (4) „ | +240·2 | +57·4 | +182·9 | + 50·0 | + 0·1 | +29·8 | — | +320.2 | +262·8 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

1. නිදන් අරමුදල් වෙනුවෙන් ඇති ආයෝජන වල වෙළෙඳ වටිනාකම පිළිබිඹු වෙයි. (අනුපූරක නිදන් අරමුදල් ඇතුළුව)

2. ජා මු, අරමුදලට, ජා. ප්‍ර. ස. බැංකුවට හා ජා. ස. ස. ට සාමාජික ගාස්තු වශයෙන් 1964 සැප්තැම්බර් මාසයේදී ගෙවන ලද රුපියල් කෝටි 3·97 ක හා 1965 සැප්තැම්බර් මාසයේ ගෙවන ලද රුපියල් කෝටි 6·12 ක විශේෂ ණය ඇතුළත් වෙයි. මෙම විශේෂ ණය අඩුකළ විට, මුදල් වර්ෂය තුල මහ බැංකු අත්තිකාරම් රුපියල් කෝටි 0·83 කින් වැඩිවී ඇත.

3. 1965 සැප්තැම්බර් අවසානය වන විට නිකුත්කර තිබුන හා ගෙවීමට තිබුන ජාතික සංවර්ධන පිළිනපත් වල වටිනාකම් රුපියල් 67,522 ක් විය.

4. + ලකුණෙන් වැඩිවීමක් දැක්වෙයි.

## සංඛ්‍යා සටහන II (ඉ) 11

### දේශීය ණය - කල් පිරීම් අනුව

### (සැප්තැම්බර් අවසානයේදී)

රුපියල් දශ ලක්ෂ

| | 1960 | | 1961 | | 1962 | | 1963 | | 1964 | | 1965 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය | සියයට ගණන | ප්‍රමාණය | සියයට ගණන | ප්‍රමාණය | සියයට ගණන | ප්‍රමාණය | සියයට ගණන | ප්‍රමාණය | සියයට ගණන | ප්‍රමාණය | සියයට ගණන |
| චල ණය† .. | 719·9 | 37·2 | 947·4 | 40·4 | 1,178·4 | 43·7 | 1,346·6 | 44·4 | 1,465·9 | 43·4 | 1,545·9 | 41·8 |
| අරමුදල් ගත ණය – අවුරුදු 5 ට අඩු ✱ .. | 330·6 | 17·1 | 271·2 | 11·6 | 272·7 | 10·1 | 246·2 | 8·1 | 205·8 | 6·1 | 245·5 | 6·6 |
| අවුරුදු 5 හා 10 අතර ✱ .. | 127·5 | 6·6 | 185·1 | 7·9 | 229·5 | 8·5 | 365·4 | 12·1 | 445·0 | 13·2 | 392·3 | 10·6 |
| අවුරුදු 10 හා 15 අතර✱ .. | 295·0 | 15·2 | 230·2 | 9·8 | 180·2 | 6·7 | 222·9 | 7·4 | 216·6 | 6·4 | 336·6 | 9·1 |
| අවුරුදු 5 හා 20 අතර ✱ .. | 336·6 | 17·4 | 386·0 | 16·5 | 386·0 | 14·3 | 249·1 | 8·2 | 247·0 | 7·3 | 127·1 | 3·4 |
| අවුරුදු 20 ට වැඩි ✱ .. | 127·0 | 6·6 | 324·1 | 13·8 | 446·8 | 16·6 | 600·0 | 19·8 | 795·0 | 23·6 | 1,048·1 | 28·4 |
| එකතුව .. | 1,936·7 | 100·0 | 2,344·0 | 100·0 | 2,693·7 | 100·0 | 3,030·2 | 100·0 | 3,375·3 | 100·0 | 3,695·5 | 100·0 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

† භාණ්ඩාගාර බිල්පත්, බදු සංචිත සහතික, මහ බැංකු අත්තිකාරම් හා ජාතික සංවර්ධන පිළිනපත් ඇතුළත් වේ.

✱ කල්පිරෙන අවසාන දිනය දක්වා.

1965 සැප්තැම්බර් 30 වැනි දිනට වූ, දළ දේශීය ණයෙහි කල් පිරීමේ පිළිවෙල, ඉකුත් මුදල් වර්ෂ පහේ අනුරූප සංඛ්‍යා තොරතුරු සමග II (ඉ) - 11 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. 1964 සැප්තැම්බර් 30 වෙනිදයින් අවසන් වූ මුදල් වර්ෂය තුළ දේශීය ණයෙහි කල්පිරීමේ කාලය දීර්ඝ කැරුන බව 1964 සඳහා වූ වාර්ෂික වාර්තාවේ සඳහන් කරන ලදී. මෙම පිළිවෙල 1964/65 වසර තුළ දී ද එලෙසම පවත්වාගෙන යන ලදී. 1964/65 දී, අවුරුදු 20 ඉක්මවා කල්පිරෙන දේශීය ණය ප්‍රමාණය මුළු දේශීය ණයෙන් සියයට 28·4 ක් වූයේ, මුදල් වර්ෂය තුළ සියයට 4·8 කින් වැඩිවිය. මෙයට අනුරූපව, චල ණයද සියයට 1·6 කින් පහළ වැටුනේ, 1965 සැප්තැම්බර් අවසානයේදී තිබූ මුළු ණය ප්‍රමාණයෙන් සියයට 41·8 ක් විය.

## රුපියල් සුරැකුම් පත්

පසුගිය මුදල් වර්ෂ පහ තුළ ගන්නා ලද හා ගෙවන ලද ණය පහත දැක්වේ.

රුපියල්.

| මුදල් වර්ෂය | ගන්නා ලද ණය | ගෙවන ලද ණය |
|---|---|---|
| 1960/61 | 26,95,83,200 | 8,97,48,800 |
| 1961/62 | 19,36,99,600 | 7,50,00,000 |
| 1962/63 | 22,13,25,700 | 5,20,81,000 |
| 1963/64 | 31,50,00,000 | 8,91,48,300 |
| 1964/65 | 26,38,77,600 | 2,36,71,300 |

සංඛ්‍යා:—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

1964/65 මුදල් වර්ෂය තුළ නිකුත් කරන ලද රුපි. කෝටි 26·39 ක්වූ රුපියල් ණයපත් වලින් රුපි. කෝටි 1·15 ක් සඳහා වූ ණයපත් දෙකක් සියයට 3½ හැරවුම් ණය විය. මුළු වශයෙන් රුපි. කෝටි 25·24 ක් සඳහා වූ ඉතිරි ණය පත් අට (වර්ෂ 21-25) සියයට 4½ පොළියට මුදලින් ගනු ලැබීය. 1969/71 සියයට 3½ ණය පත් (හැරවුම්) හා 1985/89 'එච්' කාණ්ඩයේ සියයට 4½ ණයපත් එක්විට නිකුත් කරනු ලැබිණ. ඒ ඒ ණයපත් වෙනුවෙන් ලැබුන ප්‍රමාණයන් වෙන් වශයෙන් දක්වා නොමැති වුවද, මෙම ණයපත් සඳහා මුළු වශයෙන් රුපි. කෝටි 3.7 ක් එකතු විය. ලැබීඇති ප්‍රමාණයෙන් රුපි. කෝටි 0·39ක් ගෙවීමට තිබුන මුදල් ආපසු හැරවීම් වශයෙන් ලැබිණි. රුපි. කෝටි 0·69 ක් සඳහා වූ දෙවැනි හැරවුම් ණයපත් (1970/72 සියයට 3½ ණයපත්) නිකුත් කරන ලද්දේ, 1965 ජූලි මාසයේදී බේරීමට නියමිතව තිබුන, 1963/65 සියයට 2½ ණයපත් කොටසක් වශයෙන් ආපසු හරවා ගැනීම සඳහා ය. සියයට 3½ හැරවුම් ණයෙහි ව්‍යාපාර වස්තු වශයෙන් එකී කල් පිරුන ණයෙහි රුපි. කෝටි 0·5 ක් වූ ව්‍යාපාර වස්තු පවරා දෙනු ලැබූ අතර, ඉතිරි කොටස මුදලින් ලැබිණි. අනෙකුත් ණයපත් නිකුතුන් අටම මුළු මනින්ම මුදලින් ලබා ගැනීම සඳහා විය. ණයපත් බෙදී ගිය අයුරු II (ඉ) 12 වැනි සංඛ්‍යා සටහනෙහි වර්ගීකොට දැක්වේ.

II (ඉ) 12 වැනි සංඛ්‍යා සටහනෙන් දැක්වෙන පරිදි, 1964/65 දී නිකුත් කරන ලද ණයපත් වලින් ඉතිරි කිරීම් ආයතන විසින් ලබාගෙන ඇත්තේ රුපියල් කෝටි 3·88 ක් (සියයට 14·7 ක්) පමණෙකි. 1963/64 දී එකී ආයතන ලබාගත් ණයපත් ප්‍රමාණය රුපි. කෝටි 7·99 ක් (සියයට 25·4) විය. අනෙකුත් ප්‍රධාන දායකයන් විසින් ණයපත් ගෙන ඇත්තේ මෙසේය: සේවක අර්ථසාධක අරමුදල රුපි. කෝටි 7·24 (සියයට 27·4), නිදන් අරමුදල් රුපි. කෝටි 5·25 (සියයට 19·9), රක්ෂණ සංස්ථාව රුපි. කෝටි 4·22 (සියයට 16·0), භාරකාර මණ්ඩල, සුභසාධක හා විශ්‍රාම වැටුප් අරමුදල් සහ අනෙකුත් අර්ථසාධක අරමුදල් (සේවක අර්ථසාධක අරමුදල හැර) රුපි. කෝටි 3·15 (සියයට 11·9).

## සංඛ්‍යා සටහන II (ඉ) 12

# 1964/65 රජයේ සුරැකුම්පත් දයක දීමනා බෙදී ගිය අයුරු.

රුපියල් දශ ලක්ෂ

| | 1985/89 'ජී' කාණ්ඩය $4\frac{1}{2}\%$ ණය | 1969/72 $3\frac{1}{2}\%$ ණය * හැරවීම | 1969/72 $3\frac{1}{2}\%$ ණය * මුදල් | 1985/89 'එච්' කාණ්ඩය $4\frac{1}{2}\%$ ණය | 1986/90 $4\frac{1}{2}\%$ ණය | 1986/90 'බී' කාණ්ඩය $4\frac{1}{2}\%$ ණය | 1986/90 'සී' කාණ්ඩය $4\frac{1}{2}\%$ ණය | 1986/90 'ඩී' කාණ්ඩය $4\frac{1}{2}\%$ ණය | 1970/72 $3\frac{1}{2}\%$ ණය† හැරවීම | 1970/72 $3\frac{1}{2}\%$ ණය† මුදල් | 1986/90 'ඊ' කාණ්ඩය $4\frac{1}{2}\%$ ණය | 1986/90 'එෆ්' කාණ්ඩය $4\frac{1}{2}\%$ ණය | එකතුව ප්‍රමාණය | එකතුව සියයට ගණන |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| වෙළෙඳ බැංකු .. | 1·0 | — | — | — | — | — | — | — | — | — | — | — | 1·0 | 0·4 |
| ඉතිරි කිරීමේ ආයතන .. | 4·5 | — | — | 3·5 | 3·0 | 6·8 | 4·0 | 5·0 | — | — | 9·0 | 3·0 | 38·8 | 14·7 |
| නිදන් අරමුදල් .. | 0·1 | — | 2·7 | 11·0 | 12·5 | 7·8 | 9·5 | 5·0 | 3·9 | — | — | — | 52·5 | 19·9 |
| දෙපාර්තමේන්තු හා අනෙකුත් කාර්යාලයීය අරමුදල් .. | 8·4 | — | — | 1·7 | 0·8 | 0·3 | 1·5 | 1·5 | — | — | — | 0·2 | 14·4 | 5·5 |
| භාරකාර මණ්ඩල, සුභසාධක සහ විශ්‍රාම වැටුප් හා අර්ථසාධක අරමුදල්:- .. | | | | | | | | | | | | | | |
| (1) සේවක අර්ථසාධක අරමුදල .. | 8·0 | — | — | 7·8 | 9·2 | 6·5 | 9·9 | 10·0 | — | — | 10·2 | 10·8 | 72·4 | 27·4 |
| (2) අනෙකුත් .. | 3·1 | ... | 0·1 | 2·4 | 3·5 | 5·2 | 4·4 | 4·3 | ... | 0·7 | 4·8 | 3·0 | 31·5 | 11·9 |
| රක්ෂණ අරමුදල් .. | | | | | | | | | | | | | | |
| (1) රක්ෂණ සංස්ථාව .. | 4·4 | — | — | 5·2 | 5·6 | 2·7 | 5·4 | 2·7 | — | — | 10·7 | 5·5 | 42·2 | 16·0 |
| (2) රක්ෂණ සමාගම් .. | — | 0·2 | 1·2 | 0·7 | 0·3 | 0·5 | — | 0·8 | 1·1 | 1·1 | 0·1 | 0·6 | 6·6 | 2·5 |
| අනෙකුත් රජයේ සමායතන .. | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | — |
| අනෙකුත් සමාගම් .. | — | — | — | ... | ... | — | — | ... | — | — | 0·1 | 0·1 | 0·2 | 0·1 |
| පුද්ගලයන්, සමාජ හා ආයතන .. | 0·6 | ... | 0·3 | 0·1 | 0·2 | 0·2 | 0·3 | 0·7 | 0.1 | — | 0·2 | 1·9 | 4·6 | 1·7 |
| එකතුව .. | 30·0 | 0·3 | 4·3 | 32·4 | 35·0 | 30·0 | 35·0 | 30·0 | 5·1 | 1·8 | 35·0 | 25·0 | 263·9 | 100·0 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

* 1964 දෙසැම්බර් මස ආපසු ගෙවීමට නියමව තිබූ 1962–64 සියයට $2\frac{1}{2}\%$ ලංකාණ්ඩුවේ ණය මුදල හැරවීමෙන් මෙම ණය ලබා ගන්නා ලදී.

† 1965 ජුලි මස ආපසු ගෙවීමට නියමව තිබූ 1963–65 සියයට $2\frac{1}{2}\%$ ලංකාණ්ඩුවේ ණය මුදල හැරවීමෙන් මෙම ණය ලබා ගන්නා ලදී.

1963/64 දී හා 1964/65 දී රජයේ සුරැකුම් පත් බෙදී ගිය අයුරු 1962/63 අනුරූප සංඛ්‍යා තොරතුරු සමග II (ඉ) 13 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

සංඛ්‍යා සටහන II (ඉ) 13

**1962/63 සිට 1964/65 රජයේ සුරැකුම් පත් බෙදී ගිය අයුරු**
**වර්ග කොට සැසඳීම**

රුපියල් දශ ලක්ෂ

| | 1962/63 | | 1963/64 | | 1964/65 | | 1963/64ට වඩා 1964 / 65 වෙනස |
|---|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය | % | ප්‍රමාණය | % | ප්‍රමාණය | % | ප්‍රමාණය |
| බැංකු අංශය: | | | | | | | |
| වාණිජ බැංකු .. | 25·4 | 11·5 | 33 0 | 10·5 | 1·0 | 0·4 | – 32·0 |
| සමූපකාර ප්‍රාදේශීය බැංකු .. | 0·3 | 0·1 | – | – | – | – | – |
| බැංකු නොවන: | | | | | | | |
| ඉතිරි කිරීමේ ආයතන .. | 17·3 | 7·8 | 79·9† | 25·4 | 38·8 | 14·7 | – 41·1 |
| නිදහස් අරමුදල් .. | 36·4 | 16·4 | 46·3 | 14·7 | 52·5 | 19·9 | + 6·2 |
| දෙපාර්තමේන්තු හා අනෙකුත් කාර්යාලයීය අරමුදල් .. | 7·5 | 3·4 | 21·4 | 6·8 | 14·4 | 5·5 | – 7·0 |
| භාරකාර මණ්ඩල, සුභසාධක සහ විශ්‍රාම වැටුප් හා අර්ථසාධක අරමුදල් | | | | | | | |
| 1. සේ. අ. අ. .. | 67·8 | 30·6 | 65·0 | 20·6 | 72·4 | 27·4 | + 7·4 |
| 2. අනෙකුත් .. | 36·6 | 16·5 | 25·8 | 8·2 | 31·5 | 11·9 | + 5·7 |
| රක්ෂණ අරමුදල් | | | | | | | |
| 1. රක්ෂණ සංස්ථාව .. | 12·9 | 5·8 | 29·0 | 9·2 | 42·2 | 16·0 | + 13·2 |
| 2. රක්ෂණ සමාගම් .. | 13·4 | 6·1 | 8·9 | 2·8 | 6·6 | 2·5 | – 2·3 |
| අනෙකුත් රජයේ සමායතන .. | – | – | 3·5 | 1·1 | – | – | – 3·5 |
| අනෙකුත් සමාගම් .. | 0·8 | 0·4 | 0·3 | 0·1 | 0·2 | 0·1 | – 0·1 |
| පුද්ගලයන්, සමාජ හා ආයතන .. | 3·2 | 1·4 | 1·7 | 0·5 | 4·6 | 1·7 | + 2·9 |
| එකතුව .. | 221·3 | 100·0 | 315·0 | 100·0 | 263·9* | 100·0 | – 51·1 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

† මෙම ප්‍රමාණයෙන් රුපියල් කෝටි 5·25 ක් 1974 සියයට 3¾% නේ හැරවුම් ණය සඳහා වූ දයක දීමනා වලින් සමන්විතයි.

* මෙම ප්‍රමාණයෙන් රුපියල් කෝටි 0·46 ක් 1971 සියයට 3½ හැරවුම් ණය සඳහා වූ දයක දීමනා වලින් ද රුපියල් කෝටි 0·69 ක් 1972 සියයට 3½ රේ හැරවුම් ණය සඳහා වූ දයක දීමනා වලින් ද සමන්විතයි.

රජයේ සුරැකුම්පත් වලට දායක වී ඇති පිළිවෙලෙහි දක්නට ලැබෙන විශේෂ ලක්ෂණයක් නම්, බැංකු නොවන ආයෝජකයන් විසින් මිලයට ගනු ලැබූ සුරැකුම්පත් වල අනුපාතය වේගයෙන් වැඩිවීමය. වෙළෙඳ බැංකු විසින් මිලයට ගනු ලැබූ ප්‍රමාණය 1963/64 දී සියයට 10·5 ක් වූ අතර, 1964/65 දී සියයට 0·4 දක්වා අඩුවිය.

දිගු කාලීන (අවුරුදු 20 - 25) රජයේ ණය සඳහා වූ පොළී අනුපාතිකය 1963 ජූනි 1 වැනි දින සියයට 4¼ සිට සියයට 4½ දක්වා වැඩි කළේ, එතැන් පටන් එම මට්ටමෙහි ම පැවැතිණි.

**භාණ්ඩාගාර බිල්පත්**

මුදල් වර්ෂය ඇරඹෙන විට, නිකුත් කොට නොබේරා තිබුන භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය රුපියල් කෝටි 125·0 ක් විය. එදිනට බලය ලත් සීමාව රුපියල් කෝටි 150·0 ක් විය. ආදායම් වර්ෂය අවසාන වන විට නොබේරා තිබුන භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය රුපියල් කෝටි 130·0 ක් විය. මේ අනුව රුපියල් කෝටි 5·0 ක වැඩිවීමෙක් දක්වේ. එසේ ම භාණ්ඩාගාර බිල් පත් නිකුත් කිරීමට හැකි සීමාවෙන් ප්‍රයෝජනයට නොගත් ශේෂය රුපියල් කෝටි 20·0 ක් විය.

මුදල් වර්ෂය ඇරඹෙන විට සියයට 2.8 ක්වූ භාණ්ඩාගාර බිල්පත් සඳහාවූ වාර්ෂික පොළී අනුපාතිකය 65-7-15 වැනි දින සිට ක්‍රමයෙන් වැඩි වී 65-9-15 වැනි දින වන විට සියයට 3.0 විය. මුදල් වර්ෂය අවසාන වනතෙක්ම එම අනුපාතිකය එසේම පැවතිනි. (පරිශිෂ්ටයේ 22 වැනි සංඛ්‍යා සටහන බලන්න). මහ බැංකුව විසින් මිලදී ගන්නා ලද භාණ්ඩාගාර බිල්පත් සඳහා වර්ෂය ආරම්භයේදී රුපියල් කෝටි 0·76 ක වාර්ෂික පොළියක් ලැබුන අතර, 65-8-16 වැනි දින භාණ්ඩාගාර බිල්පත් නිකුතුවේ සිට එය සියයට 1·0 දක්වා වැඩිවිය.

## විදේශීය ණය

1964/65 දී දළ විදේශීය ණය (ආපසු ගෙවීම් අඩු කිරීමෙන් පසු) රුපියල් කෝටි 7·71 කින් වැඩිවිය. 1963/64 දී මෙහි වැඩිවීම රුපියල් කෝටි 0·5 ක් විය. 1964/65 දී ඇතිවූ වැඩිවීම II (ඉ) 14 සංඛ්‍යා සටහනෙහි විග්‍රහකොට දක්වා ඇත.

### සංඛ්‍යා සටහන II (ඉ) 14

### විදේශීය ණය

රුපියල් දශ ලක්ෂ

| | 1964/65 දී වැඩිවීම * | 1965 සැප්තැම්බර් 30 වැනි දිනට වගකීම |
|---|---|---|
| ජාත්‍යන්තර ප්‍රතිසංස්කරණ හා සංවර්ධන බැංකු ණය .. | 5·0 | 139·7 |
| කැනේඩියානු අ. ණ. ර. ස. ණය .. .. | 12·7 | 15·7 |
| කැනේඩියානු ණය .. .. | – 1·3 | 4·6 |
| චීන ණය .. .. | 18·9 | 40·5 |
| එක්සත් රාජධානියේ ණය මාලාව (ඊ සී.ජී.ඩී.) .. .. | – 0·8 | 20·9 |
| එක්සත් රාජධානියේ රන් පවුම් සුරකුම් පත් .. .. | — | 107·9 † |
| ප්‍රංශ එස්.ඕ.සී ඊ.ඒ. ණය .. .. | 5·5 | 5·5 |
| ඇමෙරිකා එක්සත් ජනපදයේ සංවර්ධන ණය අරමුදලේ ණය .. | – 1·0 | 10·7 |
| ඇමෙරිකාඑක්සත් ජනපදයේ අයි. සී .ඒ. ණය .. .. | – 0·2 | 35·0 |
| පෝලන්ත ණය මාලාව .. .. | 2·4 | 2·4 |
| සෝ ස.ස.සං යේ ණය .. .. | 28.8 | 83·1 |
| බටහිර ජර්මන් ණය .. .. | 7·4 | 19·2 |
| යූගෝස්ලේවියානු ණය මාලාව .. .. | – 0.3 | 4·1 |
| එකතුව .. .. | 77·1 | 489·3† |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

* එනම් ආපසු ගෙවුම් හැර ආපසු ලබා ගැනීම්.

† පවුම් සුරකුම් පත් බේරීම සඳහා පවත්වාගෙන යන ලද නිදන් අරමුදල රුපියල් කෝටි 4·27 ක් විය. මෙම නිදන් අරමුදල් සඳහා ගැලපීම් ඇති කිරීමෙන් පසු ශුද්ධ වගකීම් ප්‍රමාණය රුපියල් කෝටි 44·66 ක් විය.

– සලකුණෙන් ශුද්ධ ආපසු ගෙවීම් දැක්වේ.

1964/65 මුදල් වර්ෂය තුළදී පහත සඳහන් ණය සඳහා ගිවිසුම් අත්සන් කොට තිබුනේ වුවද, ඒවායින් මුදල් ලබාගෙන නොමැත.

| | | ප්‍රමාණය | ගිවිසුමේ දිනය |
|---|---|---|---|
| 1. | අංක 4 දරන අයි. සී ඒ. ණය | රුපි. 72,38,240 | 61–9–22 |
| 2. | ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ නියෝජ්‍යත්වයේ ණය | රුපි. 89,30,000 | 62–8–31 |
| 3. | පැරිස් බැංකුවේ (ප්‍රංසය) ණය මාලාව | පවුම් 1,00,00,000 | 64–12–1 |
| 4. | චීන ණය (පොළී අය නොකැරෙන) | රුපි. 2,00,00,000 | 64–10–25 |
| 5 | ප්‍රජාතන්ත්‍රවාදී ජර්මන් සමූහාණ්ඩුවේ ණය මාලාව | රුපි. 1,50,00,000 | 65–2–2 |

## නිදන් අරමුදල්

රාජ්‍ය ණය බේරීම සඳහා පිහිටුවන ලද නිදන් අරමුදලේ වෙළෙඳ වටිනාකම, 1964/65 මුදල් වර්ෂය අවසාන වන විට රුපියල් කෝටි 41.29 ක් විය. මෙයින් මුදල් වර්ෂය තුළ ඇතිවූ රුපියල් කෝටි 6.16 ක වැඩිවීමක් පෙන්නුම් කැරේ. මේ වැඩිවීම පහත සඳහන් අයුරු සැකැසී ඇත.

| | | | |
|---|---|---|---|
| නිදන් අරමුදලට දයක දීමනා | රුපි කෝටි | 5.27 | |
| ආයෝජන සඳහා පොළිය | රුපි. කෝටි | 1.43 | |
| ආයෝජනවල වෙළෙඳ වටිනාකමෙහි අගය වැඩිවීම | රුපි. කෝටි | 0.75 | කෝටි 7.45 |
| අඩුවීම් | | | |
| ණය ආපසු ගෙවීම් සඳහා උපයෝගි කර ගත් ණය ප්‍රමාණය | | | කෝටි 1.29 |
| | | | කෝටි 6.16 |

## අර්ධ රාජ්‍ය ආයතන විසින් ගත් ණය

රජයේ අවශ්‍යතාවන් සඳහා හැකිතාක් සම්පත් මාර්ග සපයා දීමෙන්ද, රජයේ මුදල් තත්ත්වයද, ජාතික නිවාස කොමසාරිස්ගේ හා රජයේ උකස් බැංකුවේ අවශ්‍යතාද අනුව, එම ආයතනයන්ට අවශ්‍ය මුදල් රජයේ ණය අරමුදල් වලින් ණයට දෙන පරිදි රජයට උපදෙස් දීමෙන්ද, මහ බැංකුව ඉකුත් මුදල් වර්ෂ දෙකේදී අනුගමනය කළ ප්‍රතිපත්තියම අනුගමනය කළාය.

### (1) ජාතික නිවාස දෙපාර්තමේන්තුව

1964/65 දී ජාතික නිවාස ණය කර නිකුත් නොකැරිණි. එසේම රජය විසින් අවක්‍ර ණය අනුමත කිරීමක් ද නොවිණි. මුදල් වර්ෂය අවසානයේදී නිකුත් කරන ලදුව බේරීමට ඉතිරිව තිබූ නිවාස ණයකරවල එකතුව රුපියල් කෝටි 7.5 ක්ද, රජය විසින් අනුමත කැරුන අවක්‍ර ණය එකතුව රුපියල් කෝටි 7.0 ක්ද නොවෙනස්ව පැවතිනි. මේ අනුව, පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද ණයෙන් ඉතිරිව ඇති ප්‍රමාණය රුපියල් කෝටි 7.5 ක් විය. මුදල් වර්ෂය අවසානයේදී ජාතික නිවාස ණයකර බේරීම සඳහා පිහිටුවන ලද නිදන් අරමුදල්වල වෙළෙඳ වටිනාකම රුපියල් කෝටි 2.78 ක් විය.

### (2) රජයේ උකස් බැංකුව

1964/65 දී රජයේ උකස් බැංකුව අලුත් ණයකර නිකුත් කොට නොමැත. එහි ගනුදෙනු කරගෙන යාමට බොහෝ සෙයින්ම පිහිට කර ගනු ලැබුයේ බැංකු ක්‍රමයෙන් සැලසුන අයිරා පහසුකම්ය. කලින් නිකුත් කරන ලද ණයකර වලින් නොබේරූ ඉතිරිය රුපියල් කෝටි 3.33 ක් වූ අතර රජයේ උකස් බැංකු ආඥා පනතේ 73, 75 හා 84 යන වගන්ති යටතේ ඇපවුන අයිරා වසර තුළ රුපියල් කෝටි 0.81 ක වැඩිවීමක් පිළිබිඹු කරමින් රුපියල් කෝටි 3.24 දක්වා වැඩිවිය. මේ අනුව, මුදල් වර්ෂය අවසානයේදී බැංකුවේ ණය ගැතිකම රුපියල් කෝටි 6.56 ක්වූ අතර, අනුමත වූ ණය සීමාවෙන් නොගත් ඉතිරිය රුපියල් කෝටි 0.2 ක් විය. 1963/64 මුදල් වර්ෂය අවසානයේදී බැංකුවේ මුළු ණය ගැතිකම රුපියල් කෝටි 5.76 ක් විය.

**ආ කොටස-1965/66 මුදල් වර්ෂය**

**1965/66 අයවැය ලේඛනය.**

1965/66 වසර සඳහා පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද ආදායම් හා වියදම් ඇස්තමේන්තු (මුල්) II (ඉ) 15 සංඛ්‍යා සටහනේ පිඩුකොට දක්වා ඇත.

සංඛ්‍යා සටහන II (ඉ) 15

මුල් අය වැය ඇස්තමේන්තු

රුපියල් දශ ලක්ෂ

| | | | | |
|---|---|---|---|---|
| (අ) | ආවර්ථන වියදම් (වැය සම්මත 1, 2, 4 හා 6) | .. | 1924.0 | |
| | සියයට $4\frac{1}{2}$ ක ඌන වියදම් අඩු කොට* | .. | 45.7 | 1878.3 |
| (ආ) | ප්‍රාග්ධන වියදම් වැය සම්මත 3, 5 හා 7) | .. | | 578.1 |
| (ඇ) | මුළු වියදම [(අ)+(ආ)] | .. | | 2456.4 |
| (ඈ) | ආදායම් (නව බදු ලැබීම් ඇතුළත්ව) | .. | | 1897.8 |
| (ඉ) | අය වැය හිඟය [(ඇ)-(ඈ)] | .. | | 558.6 |
| (ඊ) | නිදන් අරමුදල් සඳහා දයක දීමනා හා රාජ්‍ය ණය ආපසු ගෙවීම් හැර | .. | | 97.2 |
| (උ) | ඇස්තමේන්තු කළ ශුද්ධ අය වැය හිඟය | .. | | 461.4 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

* රුපියල් කෝටි 182.68 න් සියයට $2\frac{1}{2}$; මෙම සංඛ්‍යාව ලබාගත්තේ ආවර්තන වියදමෙන් නිදන් අරමුදල් දයක දීමනා හා ආදායමෙන් කැරෙන අවක්‍ර රාජ්‍ය ණය බේරීම (රුපියල් කෝටි 9.72) අඩු කිරීමෙනි.

රුපියල් කෝටි 55.86 ක්වූ අයවැය හිඟය පියැවූයේ මෙසේය:—

| | | රුපි. කෝටි |
|---|---|---|
| (අ) | බැංකු නොවන දේශීය මාර්ග වලින් ණය | 27.5 |
| (ආ) | විදේශාධාර | 17.5 |
| (ඇ) | පරිපාලන ණය | 2.5 |

මේ අනුව ඇතිවන නොපියවූ රු. කෝටි 8.36 අයවැය හිඟයෙන් ඇතිවන ප්‍රාසාරණාත්මක බලපෑම වේ.

**ආදායම**

1965/66 වර්ෂය සඳහා ඇස්තමේන්තු කරන ලද මුළු ආදායම (අයවැය ලේඛනයෙන් යෝජිත විධි විධාන වලින් ලැබෙන රුපියල් කෝටි 1.4 ක ශුද්ධ ලැබීමක්ද ඇතුළුව) රුපියල් කෝටි 189.78 ක් විය. මෙම ආදායම 1964/65 දී රුපියල් කෝටි 181.64 ක්වූ නියම (තාවකාලික) ආදායම සමග සැසඳිය හැකිය. මේ අනුව, මෙම මුදල් වර්ෂයේ අයවැය ඇස්තමේන්තු වලින් දක්වෙන ආදායම ඉකුත් මුදල් වර්ෂයේ නියම (තාවකාලික) ආදායමට වඩා රුපියල් කෝටි 8.14 කින් වැඩිවේ.

කලින් වර්ෂයේදීට වඩා රුපියල් කෝටි 8.14 ක්වූ මෙහි වැඩිවීම සැකසෙනුයේ ප්‍රධාන වශයෙන්ම, පහත සඳහන් මාර්ගයන්ගෙන් බලාපොරොත්තු වන ආදායම් වැඩිවීම් මගිනි.

| | |
|---|---|
| රේගු බදු | (රුපියල් කෝටි 10.10) |
| දේශීය භාණ්ඩ බදු | (රුපියල් කෝටි 0.78) |
| තැපැල් හා විදුලි සංදේශ සේවා | (රුපියල් කෝටි 0.63) |
| පොළිය හා වාර්ෂිකයන් | (රුපියල් කෝටි 0.45) |
| දුම්රිය දෙපාර්තමේන්තුව | (රුපියල් කෝටි 0. 6) |
| විවිධ ආදායම | (රුපියල් කෝටි 1.21) |
| විදුලි දෙපාර්තමේන්තුව | (රුපියල් කෝටි 1.30) |

මෙම ආදායම් වැඩිවීම්, පහත සඳහන් ආදායම් අඩුවීම් නිසා තරමකට මැකී ගියේය.

| | |
|---|---|
| ආදායම් බද්ද | (රුපියල් කෝටි 4·42) |
| වරාය හා නැව්තොට ආදායම් | (රුපියල් කෝටි 0·22) |
| බලපත්‍ර ගාස්තු හා අනෙකුත් ආදායම් | (රුපියල් කෝටි 1·97) |
| උසාවි හා කාර්යාල ගාස්තු | (රුපියල් කෝටි 0·52) |

පහත දැක්වෙනුයේ අයවැය ලේඛනයෙන් යෝජිත නව ආදායම් විධිවිධානයන් හා ඒවා මුදල් වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමෙන් බලාපොරොත්තු වන අතිරේක ආදායම්ය.

| | | රුපියල් කෝටි |
|---|---|---|
| (1) | ආහාර ආදී ශීර්ෂයන් හැර අනෙකුත් ආනයන සඳහා වූ දැනට පවත්නා බදු අනුපාතිකයනට සියයට 10 ක අධිභාරයක් පැනවීම | 2·20 |
| (2) | විදේශාධාර සඳහා සාකච්ඡා අවසන් වීමෙන් පසු වැඩිවේයැයි බලාපොරොත්තු වන ආනයන වලින් ආදායම් වැඩිවීම | 2·50 |
| (3) | ආදායම් බදු, වඩාත් ඵලදායි ලෙස ඇස්තමේන්තු කිරීමෙන් හා වඩාත් සීඝ්‍රයෙන් එකතු කිරීම | 2·00 |
| (4) | බදු සමාව | 1·50 |
| (5) | මුද්දර කාර්යාංශය | 0·14 |
| | එකතුව | 8,34 |

එසේ වුවද, පහත සඳහන් විධිවිධානයන්ගෙන් රුපියල් කෝටි 6·94 ක පාඩුවක් ඇතිවෙතැයි අපේක්ෂා කරන නිසා රජයට ලැබෙන ශුද්ධ ආදායම රුපියල් කෝටි 1·4 ක් වේයැයි ඇස්තමේන්තු කර ඇත.

| | | රුපියල් කෝටි |
|---|---|---|
| 1. | අත්‍යාවශ්‍ය භාණ්ඩ සඳහා වූ ආනයන බදු අඩු කිරීමෙන් හා ඉවත් කිරීමෙන් | 1·84 |
| 2, | බැංකු හර බද්ද ඉවත් කිරීමෙන් (ශුද්ධ පාඩුව) | 0·66 |
| 3. | විසා බද්ද ඉවත් කිරීමෙන් | 0·30 |
| 4. | විදේශීය විනිමය බද්ද ඉවත් කිරීමෙන් | 0·50 |
| 5. | ආදායම් බද්ද, ධන බද්ද හා ප්‍රාග්ධන ලාබ බදු අඩු කිරීමෙන් | 3·64 |
| | එකතුව | 6·94 |

1 රේගු බදු

දැනට පවත්නා ආනයන බදු අනුපාතිකයනට සියයට 10 ක අධිභාරයක් පනවන ලදී.* මෙම බද්දෙන්, නිදහස් වන ශීර්ෂ නම්, ආහාර ද්‍රව්‍ය, ඖෂධ හා ඖෂධීය සංයෝග, පොහොර, භූමිතෙල් ඇතුළු ඛනිජ තෙල් නිෂ්පාදිත, රෙදිපිළි, මෝටර් රථ අමතර කොටස්, සිමෙන්ති, කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ හා මෙවලම් සහ අපනයන කර්මාන්තයට අයත් ද්‍රව්‍ය ය. පසුව කී භාණ්ඩ සඳහා විශෙෂ බදු අනුපාතික පනවා ඇත. මෙම අධිභාරය නිසා රුපියල් කෝටි 2·2 ක අතිරේක ආදායමක් ලැබේයයි ඇස්තමේන්තු කොට ඇත විදේශාධාර වැඩි වීමෙන් වැඩිවිය හැකි ආනයන හේතුකොට ගෙන ආනයන බදු වශයෙන් රුපියල් කෝටි 2·5 ක අතිරේක ආදායමක් ද ලැබේයයි බලාපොරොත්තු වනු ලැබේ. මේ අනුව, මෙකී දෙවැදෑරුම් විධිවිධාන හේතුකොට ගෙන රුපියල් කෝටි 4·70 ක අතිරේක ආදායමක් ලැබේයයි බලාපොරොත්තු වනු ලැබේ.†

* 1965. 8. 9, වැනි දින හා අංක 14,475 දරන රජයේ ගැසට් නිවේදනය.

† 1966 ජනවාරි සිට බලපැවැත්වෙන ඩීසල් වර්ග සඳහා වූ ආනයන බදු වැඩිකිරීම ඇතුළත් නොවේ. මෙම වැඩිකිරීම සිදුකොට ඇත්තේ බර තෙල් බද්ද අවලංගු කිරීමෙන් වූ පාඩුව මකා ගැනීම සඳහාය

භූමිතෙල්, මිරිස්, අර්තාපල්, බොම්බයි ළූනු, රතුළූනු, පරිප්පු, කඩල, මෑ ඇට, උදළු, අලවංගු ආදී සුළු කෘෂිකාර්මික උපකරණ සහ ක්‍රීඩා භාණ්ඩ හා අමතර කොටස් සඳහා බලපැවැත්වුන ආනයන බදු අවලංගු කැරිණි. කපුපිළි සඳහාවූ ආනයන බදු ද යාරයකට සත 10 සිට 12 දක්වා වූ ප්‍රමාණයකින් අඩු කැරිණි.* මෙකී විධිවිධානයන්ගෙන් ආදායමට වන පාඩුව රුපියල් කෝටි 1·84 ක් වේයැයි ඇස්තමේන්තු කොට ඇත.

මේ අනුව, රේගු බදු වලින් ආදායමට වන ශුද්ධ ලාභය රුපියල් කෝටි 2·86 ක් බව ඇස්තමේන්තු කොට ඇත.

II. **ආදායම්, ධන හා ප්‍රාග්ධන ලාභ බදු**

අ. **ආදායම් බද්ද (අ) නේවාසික පුද්ගලයින්**-නේවාසික පුද්ගලයින් සඳහා පවුලේ තත්ත්වය අනුව වෙනස් වන සියයට 15 ප්‍රථම බදු ශ්‍රෙණිය වෙනුවට පිළිවෙලින් සියයට 10 හා සියයට 15 ගණනේ වූ බදු ශ්‍රෙණි දෙකක් පනවන ලදී.[1] මෙම මුල් ශ්‍රෙණිය අනුව තනි පුද්ගලයෙකුට රුපියල් 3,000/-ක් ද, භාර්යාව සඳහා රුපියල් 1,000/-ක් ද, යැපෙන්නන් හතර දෙනෙකු දක්වා, එක දරුවකු හෝ යැපෙන්නෙකුට රුපියල් 500/- ක් ද වෙති. කලින් පිළිවෙල අනුව, රුපි. 15,000 ට නොවැඩි තක්සේරු කළහැකි ආදායමක් ලැබූ බදු ගෙවන්නන්ගෙන් බදු අයකළ හැකි වූ රුපි. 1,000/- මුල් බදු ශ්‍රෙණිය සඳහා සියයට 5 ක බද්දක් අය කරන ලදී. එහෙත් දැනට පනවා ඇති බදු අනුපාතිකය අනුව මෙකී සහනදායක බදු අනුපාතිකය අදාළ වනුයේ බදු අයකළ හැකි ආදායම රුපි. 2,000/-[2] නොඉක්මවන අයගේ මුල් රුපි. 1,000/- බදු ශ්‍රෙණිය සඳහා ය. පුද්ගලයන්ගෙන් අය කැරෙන උපරිම ආන්තික බදු අනුපාතිකයන් සියයට 45 ක් වෙයි. එහෙත් උසස් බදු පංතීන්ගෙන්, මෙයට අමතරව අධි බද්දක් ද අයකරන අතර ඉතිරි කිරීම් සඳහා, පසුව විස්තර කැරෙන පරිදි, බදු ප්‍රතිදානයක් දෙනු ලැබේ. වියදම් බද්දක තැන ගන්නා අධිබද්ද සියයට 20 ක් හා සියයට 35 ක් වන බැවින් වැඩිම ආන්තික බදු අනුපාතිකය සියයට 80 ක් වෙයි.[3]

බදු අයකළ හැකි ආදායම් ඇති පුද්ගලයන්ගෙන්, සියයට 45 ක ආන්තික බදු අනුපාතිකයට යටත්ව, අධි බද්ද අයකැරෙන අන්දම පහත දැක්වේ.

| | |
|---|---|
| මුල් රුපි. 10,000 සඳහා | නැත. |
| ඊලඟ රුපි. 15,000 සඳහා | සියයට 20 |
| බදු අයකළ හැකි ඉතිරි ආදායම සඳහා | සියයට 35 |

(ආ) **අනේවාසික පුද්ගලයන්**-අනේවාසික පුද්ගලයන් සඳහා සංශෝධිත බදු ලැයිස්තුව මෙසේය:—

| | | | |
|---|---|---|---|
| මුල් රුපි. 15,000 | සියයට | 20 | ගණනේ |
| ඊලඟ රුපි. 5,000 | ,, | 25 | ,, |
| ඊලඟ රුපි. 5,000 | ,, | 35 | ,, |
| ඊලඟ රුපි. 5,000 | ,, | 40 | ,, |
| ඊලඟ රුපි. 10,000 | ,, | 45 | ,, |
| ඊලඟ රුපි. 10,000 | ,, | 65 | ,, |
| ශේෂය | සියයට | 80 | ගණනේ |

---

1. 1965 අංක 18 දරන දේශීය ආදායම් (සංශෝධිත) පනත.
2. බදු අයකළ හැකි ඉතිරි ආදායම් සඳහා සියයට 10 ක බද්දක් නියමිතය.
3. කෘෂිකර්මය හා සතුන් ඇති කිරීම පිළිබඳවූ කලින් ප්‍රතිදාන සලසා නොමැති සියළු ප්‍රාග්ධන වියදම් සඳහා ප්‍රතිදානයන් දෙනු ලැබේ. සත් වසක් දක්වා කාලයක් සඳහා අලුතින් තැනෙන නිවාස වලින් ලැබෙන ආදායමද බද්දෙන් නිදහස් වේ.

(ඈ) **සමාගම්**-සමාගම් බදු සෑකැස්මෙහි ආපසු නොගෙවන කොටස සියයට 57 සිට සියයට 50 දක්වා අඩු කැරිණි. මෙයට අමතරව, නේවාසික නොවන සමාගම් සඳහා බුදල් බද්ද වෙනුවට පැනවුන සියයට 6 ක අතිරේක බද්දක් ද, ලංකාවේ තිබෙන නිශ්චල දේපොළ වලින් ලැබේයැයි සලකන, බදු අයකළ හැකි, වස්තුව වෙනුවෙන් සියයට 5 ක බද්දක් ද අයකරනු ලැබේ. අන්‍යොන්‍ය ජීවිත රක්ෂණ සමාගම් සඳහා බලපැවැත්වෙන නව බදු අනුපාතිකය සියයට 24 ක් වෙයි.

(ඈ) **රාජ්‍යයන්**-**රාජ්‍යයන්** ලංකාණ්ඩුව හා එක්සත් රාජධානිය හැර අනෙකුත් රාජ්‍යයන්) සඳහා වූ බදු අනුපාතිකය සියයට 56 ක් වෙයි.

**ආ. ධන බද්ද**

ධනයෙන් ලැබෙන සාමාන්‍ය ආදායම සියයට 10 ක් වේයැයි ගත් කල, කලින් බලපැවැත්වූ සියයට 5 උපරිම ධන බදු අනුපාතිකය සියයට 50 ක ආදායම් බද්දකට සමාන විය. මෙම සියයට 50 අනුපාතිකය සියයට 80 ක් වූ උපරිම ආන්තික ආදායම් බදු අනුපාතිකයට එකතු කළ විටෘ ආදායමින් සියයට 130 ක් වන්නේය. මෙම දණ්ඩනීය බදු අනුපාතිකය ඉවත් කරනු වස් ධන බද්ද පහත සඳහන් පරිදි අඩු කොට ඇත.

නව බදු අනුපාතිකයන් මෙසේය:—

තක්සේරු කළහැකි ධනයෙන් මුල් රුපියල් 1,00,000 බද්දෙන් නිදහස් කරනු ලැබේ.

| | | | | |
|---|---|---|---|---|
| බදු අයකළ හැකි ධනයෙන් ඊළඟ | රුපි. | 2,00,000 | සඳහා | සියයට ½ ක් |
| බදු අයකළ හැකි ධනයෙන් ඊළඟ | රුපි. | 5,00,000 | සඳහා | සියයට ¾ ක් |
| බදු අයකළ හැකි ධනයෙන් ඊළඟ | රුපි. | 10,00,000 | සඳහා | සියයට 1 ක් |
| බදු අයකළ හැකි ඉතිරි ධනය සඳහා | | | | සියයට 2 ක්. |

මේ අනුව, පුද්ගලයෙකු විසින් ගෙවිය යුතු වන ආදායම් හා ධන බදු එකතුව එම වර්ෂය සඳහා තක්සේරු කළ ආදායමෙන් සියයට 80 කට සීමා වන්නේය.

කැල්ඩෝර් බදු ක්‍රමය ලංකාවේ මුලින් පැනවුන අන්දමට, වියදම් බද්ද ගණන් බැලීමේදී, ධන බදු ගෙවීම්, බදු අයකළ හැකි වියදමට ඇතුළත් නොකැරිණි. යෝජිත අයිබද්දෙන් ද එවැනිම සහනයක් සළසනු වස් ධන බදු ගෙවීමද ඉතිරි කිරීම් සඳහා වූ සහන ක්‍රමය යටතේ ප්‍රතිදානයන් ලැබීමට යෝග්‍යවූවකැයි ගැනේ.

ඇ **ප්‍රාග්ධන ලාභ බද්ද**- කලින් බලපැවැත් වූ ප්‍රාග්ධන ලාභ බද්ද ඉතා අධික වූවා මෙන්ම, දිගු හා කෙටි කාලීන ලාභ අතර වෙනසක් නොදක්වූවායයි සැලකුන හෙයින් සියයට 45 උපරිමයේ සිට සියයට 25 උපරිමය දක්වා අඩු කැරිණි.

**ඉතිරි කිරීම් සඳහා ප්‍රතිදාන**

මුදල් ඉතිරි කිරීම සඳහා උනන්දු කිරීමේ හා ඉතිරි කරන ආදායම් හා අයිබදු ගෙවන්නන්ට (නේවාසික හා අනේවාසික පුද්ගලයන්) සහනය සැළසීමේ අර මුණෙන්, නියමිත යම් යම් ඉතිරි කිරීම් සඳහා ප්‍රතිදාන දෙනු ලැබේ. මෙම ප්‍රතිදාන ලැබීමට ඉතිරි කිරීම් පහත සඳහන් ස්වරූපයකින් තිබිය යුතුය.

(1) රජයේ සුරැකුම්පත්හි[1] (බදු සංචිත සහතිකවල හැර) ආයෝජනයක් වශයෙන්

(2) මහ බැංකුවේ විශේෂ ගිණුමෙහි හෝ මුදල් මණ්ඩලයේ නිර්දේශයන් අනුව, මුදල් ඇමතිතුමා විසින් අනුමත කැරෙන වෙනත් ආයතනයක, තැන්පතු මුදල් වශයෙන්.

(3) නියමිත රක්ෂණ සහනයන් ඉක්මවා රක්ෂණ ඔප්පුවකට හෝ වාර්ෂික යනට ගෙවෙන වාරිකයක්.

(4) ධන බද්ද වශයෙන් ගෙවෙන ප්‍රමාණය.

(5) 1965-8 9 වැනි දිනට කලින් දේපොළ උකසට තබා ලබාගත් ණය ආපසු ගෙවීම හා

(6) අනුමත කළ ආයෝජනයන්*

---

*1. වසක් ඇතුළත දී මුදල් ආපසු ලබාගන්නේ නම් ඒ සඳහා බදු සහනයක් නොලැබේ.
69 වැනි වගන්තියේ අර්ථයට අනුවගැනෙන අනුමතකළ ආයෝජනයක්.

කලින්, ජීවිත රක්‍ෂණ වාරිකයන්ට හා අනුමත කළ විශ්‍රාම වැටුප් හා අර්ථ සාධක අරමුදල් වලට කෙරුණු දායක දීමනා වෙනුවෙන් දෙන ලද උපරිම සහනය තක්සේරු කළ හැකි ආදායමෙන් 1/6 හෝ රුපි. 4,000/- හෝ මේ දෙකෙන් අඩු ප්‍රමාණය ඉක්ම නොවිය යුතු විය. මෙම සීමාව රුපි. 10,000/- උපරිමයකට යටත්ව, තක්සේරු කළහැකි ආදායමෙන් 1/4 ක් තෙක් වැඩිකොට ඇත.

මෙම සහනය සලසා ඇත්තේ ගෙවිය යුතු බද්ද වෙනුවෙන් ප්‍රතිදානයක් දීමෙනි. මෙම ප්‍රතිදානය, සියයට 80 ගණනේ බදු අය කැරෙන ආදායමෙන් වූ ඉතිරි කිරීම් සඳහා සියයට 50 ක් ද, සියයට 65 ගණනේ බදු අය කැරෙන ආදායමෙන් වූ ඉතිරි කිරීම් සඳහා සියයට 33 $\frac{1}{3}$ ක් ද වේ. සියයට 45 ක් හෝ ඊට අඩු අනුපාතික යන් බදු වශයෙන් ගෙවන්නවුන්ට ලැබෙන ප්‍රතිදානය දානට පවත්නා අනුපාතිකය හෝ සියයට 25 ක් යන දෙකින් අඩු අනුපාතිකය වේ එමෙන්ම, රුපියල් 10,000 ක උපරිම ශුද්ධ ඉතිරි කිරීමක් හා තක්සේරු කළහැකි ආදායමෙන් $\frac{1}{4}$ පංගුවක් යන දෙකින් අඩු සීමාවකටද එම ප්‍රතිදානය සීමාවේ.

## III. ආදායම කෙරෙහි බලපාන අනෙකුත් විධිවිධානයන්

අනෙකුත් යෝජනා වලට, විදේශීය විනිමය බද්ද,[1] විසා බද්ද[2] හා බැංකු හර බද්ද[3] අවලංගු කිරීම, බදු වඩා සාර්ථක ලෙස තක්සේරු කිරීම හා ශීඝ්‍රයෙන් එකතු කිරීම සඳහා පනවා ඇති විධිවිධානයන් ක්‍රියාත්මක කිරීමත්, මුද්දර කාර්යාංශයක් පිහිටුවීමත් ඇතුළත් විය. බදු ගෙවීම පැහැර හැර ඇති විශාල සංඛ්‍යාවට සිය ආදායම් හෙළි කිරීම සඳහා කලින් වර්ෂයේදී මෙන්; සමාවක් දෙන ලදී. මේ සඳහා කලින් 1965 නොවැම්බර් 30 වැනි දින තෙක් කල්දී තිබුන අතර, පසුව එය 1966 පෙබරවාරි 21 වැනිදා තෙක් දීර්ඝ කරන ලදී.

බැංකු හර බද්ද අවලංගු කරන ලද්දේ, බැංකු මාර්ගයෙන් ගනුදෙනු කිරීමේ පුරුද්ද වැඩි දියුණු කිරීමේ හා රාශීකරණය අඩුකර ලීමේ පියවරක් වශයෙනි. මෙම විධිවිධානය හේතුකොටගෙන ආදායමට රුපි. කෝටි 0·66 ක ශුද්ධ පාඩුවක් වේයැයි ඇස්තමේන්තු කොට ඇත. විදේශීය විනිමය බද්ද හා විසා බලපත්‍ර බද්ද අවලංගු කරන ලද්දේ ඒවා බොහෝ දෙනෙකුට ඛිරිහැරදායක වූ බැවිනි. මෙම විධිවිධාන දෙක හේතුකොටගෙන ආදායමට වන පාඩුව පිළිවෙළින් රුපියල් කෝටි 0·5 ක් හා රුපියල් කෝටි 0·3 ක් වේයැයි ඇස්තමේන්තු කොට ඇත.

### වර්තන වියදම

මුළු වර්තන වියදම (වැය සම්මත, 1, 2, 4 හා 6) රුපියල් කෝටි 192·4 ක් වේයැයි ඇස්තමේන්තු කොට ඇත. මෙයින් ආවර්තන වියදම යටතේ වූ ප්‍රාග්ධන ශීර්ෂයන් හා නිදන් අරමුදල් සඳහා ප්‍රතිපාදිත කොටස අඩුකළ විට, ඉතිරි වන වර්තන වියදම රුපි. කෝටි 176·28 ක් වෙයි මෙය 1964/65 නියම වියදම (තාවකාලික) වන රුපියල් කෝටි 173·19 හා සැසැඳිය හැකිය. 1965/66 වසර සඳහා වූ ඇස්තමේන්තු ගත වර්තන වියදම (රුපියල් කෝටි 3·09 කින්) වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ පරිපාලන, සමාජ සේවා හා ආර්ථික සේවා වියදම් පිළිවෙළින් රුපි. කෝටි 2·07 කින්, රුපියල් කෝටි 1·10 කින් හා රුපියල් කෝටි 0·04 කින් වැඩිවීමය. සංක්‍රාම ගෙවුම් වියදම් රුපි. කෝටි 1·07 කින් අඩු වීමෙන් මෙම වැඩිවීම තරමක් දුරට මැකී යයි.

---

1. 1965 අංක 10 දරන පාර්ලිමේන්තු පනත
2. එම පනත
3. එම පනත

වර්තන වියදමෙහි ප්‍රධාන වෙනස්වීම් අතර ආහාර ආධාර සඳහා වූ ශුද්ධ වියදම රුපියල් කෝටි 1·25 කින් පහළ වැටීම ද වෙයි. මෙම වෙනස සැකෑසුන අයුරු II (ඉ) - 5 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. ශුද්ධ ආහාර ආධාර වියදම අඩුවීමට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ සීනි විකිණීමෙන් ලැබුන ලාභය (රුපියල් කෝටි 2·23) වැඩිවීමය. එහෙත් ආනයන කළ සහල් මෙරට නිෂ්පාදිත සහල් සඳහා ආධාර වියදම වැඩිවේ යයි බලාපොරොත්තු වන බැවින් දළ ආහාර ආධාර වියදම 1964/65 දීට වඩා රුපි. කෝටි 1·5 කින් වැඩිවේ යැයි ඇස්තමේන්තු කොට ඇත.

**ප්‍රාග්ධන වියදම**

ප්‍රාග්ධන වියදම් පිළිබඳ මුල් ඇස්තමේන්තුව (වැය සම්මත 3, 5 හා 7) රුපි. කෝටි 57·81 ක් (එනම්, මුළු වියදමෙන් සියයට 23 කට වැඩි ප්‍රමාණයක්) විය. එහෙත්, ආවර්තන වියදම් වැය සම්මත යටතේ වූ ප්‍රාග්ධන ශීර්ෂයන් හා සංචිත වලින් කැරෙන අයවැය ලේඛනයට අයත් නොවන ප්‍රාග්ධන වියදම එකතු වූ විට 1965/66 මුදල් වර්ෂයේ ඇස්තමේන්තු ගත මුළු ප්‍රාග්ධන වියදම රුපි. කෝටි 66·8 ක් වෙයි. මෙය 1964/65 සඳහා වූ නියම වියදමට (තාවකාලික) වඩා රුපි. කෝටි 8·80 කින් වැඩිය. මේ අනුව, 1965/66 වර්ෂය සඳහා කලින් වර්ෂ වලදීට වඩා වැඩි ප්‍රාග්ධන වියදමක් ප්‍රතිපාදනය කොට ඇත. එසේම, මෙහි ඌන වියදම් සැහෙන තරමින් පහත හෙළීමට තමා දැඩි ලෙස තීරණය කොට ඇති බවද, මුදල් ඇමති වරයා සිය අයවැය කථාවේදී ප්‍රකාශ කොට ඇත.

**අයවැය ලේඛනයෙන් යෝජිත අනෙකුත් විධිවිධාන**

**1. ජාතික ක්‍රම සම්පාදනය.**

සැළසුම් අනුව සාර්ථක සංවර්ධන වැඩ පිළිවෙලක් සංවිධානය කිරීමේ හා නිෂ්පාදනය හා ආයෝජන පිළිබඳ සැළසුම් ගත අරමුණු ඉටුකර ගැනීමේ අටියෙන් අගමැතිතුමා යටතේ ක්‍රම සම්පාදනය හා ආර්ථික කටයුතු පිළිබඳ නව අමාත්‍යාංශයක් පිහිටුවනු ලැබිය.

**2. ආහාර නිෂ්පාදනය වැඩිකිරීම**

මෙතෙක් පුරන් වී තිබුන අක්කර 1,00,000 ක් පමණ වන කුඹුරු මීලඟ අවුරුදු තුන ඇතුළත දී නැවත අස්වැද්දීමෙන් වී නිෂ්පාදනය වැඩි කිරීමට අදහස් කොට ඇත. පොහොර පාවිච්චිය වැඩි කිරීමට ද විධිවිධාන සලසනු ඇත. රතුළුනු සඳහා වැඩි සහතික මිලක් ලබා දීමෙන්, වැඩි වැඩියෙන් ඉඩම් බෙදාදීමෙන් හා වඩාත් අඩු වියදමෙන් වාරිමාර්ග පහසුකම් ලබා ගැනීමට සැලසීමෙන් ආහාර ද්‍රව්‍ය නිපදවන්නන් උනන්දු කිරීමට ද කටයුතු සලසනු ඇත. සතුන් ඇතිකිරීම හා ධීවර කර්මාන්තය දියුණු කිරීමට ද පියවර ගනු ලැබේ.

**3. අපනයන නංවාලීම**

සිරිත් වශයෙන් පිටරට යැවෙන තෙවැදෑරුම් අපනයන වලට අමතරව කාර්මික අපනයන නංවාලීමේ අටියෙන් 'නව කර්මාන්ත' සඳහා දනට වඩා සහන සලසා දීමෙන් ඒවා දිරි ගන්වනු ලැබේ. කාර්මික අපනයන දිරිගැන්වීම සඳහා යෝජිත විධිවිධාන මෙසේය.

1. අපනයන භාණ්ඩයේ වටිනාකමෙන් සියයට 5 ක් ආදායම් බද්දෙන් ප්‍රතිදානය කිරීම; එහෙත් එසේ කැරෙනුයේ, එම භාණ්ඩය අපනයනය කිරීමෙන් ඉපැයෙන ශුද්ධ විදේශීය විනිමය ප්‍රමාණය එහි නැ. වි. ස. වටිනාකමෙන් සියයට 25 කට නො අඩු වන්නේ නම් පමණි.

2. අපනයන භාණ්ඩ නිපදවීම සඳහා ආනයන කැරෙන අමු ද්‍රව්‍ය, බැංකු ඇපවීම් උඩ, බීදු අයකර ගැනීමක් නොමැතිව ප්‍රධාන රේගු අයකැමි විසින් මුදාලීම. හය මසක් ඇතුළත භාණ්ඩ අපනයන නොකැරිණි නම් බැංකු ඇපවීම් ක්‍රියාත්මක කරනු ලැබේ.

3. අපනයන කෑරෙන කාර්මික භාණ්ඩ වෙනුවෙන් දේශීය භාණ්ඩ බදු හා පිරිවැටුම් බද්ද අය නොකිරීම.

4. කාර්මික භාණ්ඩ අපනයන වැඩි කිරීම සඳහා තව තවත් ද්විපාර්ශ්වීය ගිවිසුම් ඇතිකර ගැනීම.

බ්‍රිතාන්‍යයේ ලංකා තේ අලෙවිය නංවාලීම සඳහා පුරා අවුරුදු තුනක ප්‍රචාරක ව්‍යාපාරයක් අරඹනු ලැබේ. මේ සඳහා රු.පි. කෝටි 0·15 ක මුදලක් ප්‍රතිපාදනය කොට ඇත.

4. රැකියා අවස්ථා වැඩිකිරීම.

රැකියා අවස්ථාවන් සලසා දීම සඳහාත්, රැකියා විරහිත වූවන් හා ඌන සේවාවෙහි නියුතු වූවන් විශාල සංඛ්‍යාව, රජයේ දෙපාර්තමේන්තුවල හා සංස්ථාවල සේවාවට බඳවා ගැනීම සඳහාත් විධිවිධාන පැනවීම කෙරෙහි ප්‍රමුඛත්වය දී ක්‍රියා කරනු ඇත.

5. ජීවන වියදම අඩුකිරීම සඳහා විධිවිධාන

මිල ස්ථාවර කොට වගා සහනය සැලසීම සඳහා පහත සඳහන් කෙටිකාලීන පියවරවල් ගැනීමට යෝජනා කොට ඇත.

(අ) ආනයන පිළියෙලවල් ක්‍රමවත්ව හැඩගැස්වීම.

(ආ) නැව්තොට හා වරාය පහසුකම් දියුණු කිරීම, අධිගාස්තු ඉවත් කිරීම හා ගැල්කුලී අඩු කිරීම.

(ඇ) පොහොර සහ ඇට වර්ග බෙදා හැරීම හා එළවළු අලෙවි කිරීම සඳහා තොග වෙළෙඳ පහසුකම් සලසා දීම.

(ඈ) ලොරි සහ ලොරිවල අමතර කොටස් ගෙන්වීම සඳහා වැඩි විනිමය ප්‍රමාණයක් ලබාදීම.

(ඉ) දැඩි මිල පාලන ක්‍රමයක් පැනවීම හා මිල පාලන රෙගුලාසි කඩ කරන අයට තවත් දැඩි දඬුවම් පැමිණවීම.

(ඊ) කළුතෙල් රථ බද්ද 66-1-1 දින සිට අවලංගු කිරීම.

(උ) මාළු බෙදා හැරීම සඳහා වඩාත් ඵලදායි අලෙවි ක්‍රමයක් ඇති කිරීම, මෙය කෑරෙනුයේ ධීවර සංස්ථාව තොග වෙළෙන්දකු ලෙස ක්‍රියා කිරීමෙනි.

6. පිටරටවලට කෑරෙන ප්‍රේෂණ සඳහා සහනයන්.

පෞද්ගලික විදේශීය ආයෝජන දිරි ගැන්වීමේ අටියෙන් ලාභාංශ, පොලී හා ලාභ ප්‍රේෂණය කෙරෙහි පනවා තිබූ සීමාවන් ලිහිල් කරන ලදී. මූලික පියවරක් වශයෙන්, 1965 අගෝස්තු මාසයේදී රු.පි. කෝටි 0·2 ක මුදලක්, (එනම්, 1965 ජූනි මාසය දක්වා එකතු වී තිබුන මුදලින් සියයට 10 ක්) ප්‍රේෂණය කිරීමට ඉඩ දෙන ලදී.

## 7. විදේශාධාර.

රජය, ජා.මු. අරමුදල හා ජා.ප්‍ර.ස. බැංකුව මාර්ගයෙන්, මිතුරු රටවල් කීපයකින් ඩොලර් කෝටි 5·0 ක පමණ ආධාර ලබා ගැනීම පිළිබඳව සාර්ථක ලෙස සාකච්ඡා පවත්වා ඇත. (එක්සත් ජනපදය රුපි. කෝටි 5·06; එක්සත් රාජධානිය රුපියල් කෝටි 4·76, බටහිර ජර්මනිය රුපි. කෝටි 3·81, ප්‍රංශය රු. කෝටි 2·38, ජපානය රු. කෝටි 2·38, ඉන්දියාව රු. කෝටි 2·0, කැනඩාව රු. කෝටි 1·43 සහ ඕස්ට්‍රේලියාව රු. කෝටි 0·7) මෙම මාර්ගයෙන් ලැබෙන ආධාර අර්ථ ක්‍රමය පණ ගන්වා ලීම සඳහා අත්‍යාවශ්‍ය ආනයන භාණ්ඩ ගෙන්වීමට හා ජාත්‍යන්තර සංචිතය පුළුල් කිරීම සඳහා උපයෝගී කරගනු ඇත

1965/66 අයවැය ලේඛනය අනුව මුළු වශයෙන් රුපි. කෝටි 17·5 ක විදේශාධාර උපයෝගී කර ගැනීමට බලාපොරොත්තු වනු ලැබේ. මෙය 1964/65 සඳහා බලාපොරොත්තු වූ ප්‍රමාණයට වඩා රුපි. කෝටි 5·0 කින් අඩුය. 1965/66 වසර තුළදී බලාපොරොත්තු වන විදේශාධාර වලින් රුපි. කෝටි 10·0 ක් නියමිත යෝජනා ක්‍රම සඳහා වෙන් කැරිණි. මෙම මුදලින් රුපි. කෝටි 6·27 ක් ණය මාලාවන් යටතේ ලැබෙන ණය වලින් ද, රුපි. කෝටි 3·23 ක් දීමනා වශයෙන්ද, ලැබේ.

විදේශීය ණය හා ණය ක්‍රම මගින් ලැබෙන මුදල් වලින්, කැනඩාවෙන් ලැබෙන රුපි කෝටි 2·11 ක ණය, මස්කෙළි ඔය සංවර්ධන ක්‍රමයේ I වැනි අවස්ථාව සඳහා ද, ජා. ප්‍ර. ස. බැංකුවෙන් ලැබෙන රුපි. කෝටි 0·83 ජල විදුලි ක්‍රමයේ II – ආ අවස්ථාව සඳහා ද, බටහිර ජර්මනියෙන් ලැබෙන රුපි. කෝටි 1·0 ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලය සඳහා ද, කැනඩාවෙන් ලැබෙන රුපි. කෝටි 0·5 නැගෙනහිර කඩදාසි කම්හල් සංයුක්ත මණ්ඩලය සඳහා ද, ප්‍රංශයේ ‘එස්ඕසීඊඒ, වෙතින් ලැබෙන රුපි. කෝටි 0·32 මහනුවර ජල සම්පාදන ක්‍රමය සඳහා ද, සෝ. ස.ස. සංගමයෙන් ලැබෙන රුපි. කෝටි 0·37 ලංකා වානේ සංයුක්ත මණ්ඩලය සඳහා ද, බ්‍රිතාන්‍යයෙන් ලැබෙන රුපි. කෝටි 0·54 කොළඹ නගරයේ විශාල ප්‍රදේශයක විදුලි සංදේශ සේවාවන් දියුණු කිරීම සඳහා ද, මහජන චීන සමූහාණ්ඩුවෙන් ලැබෙන රුපි. කෝටි 0·49 මගීන් හා බඩු ගෙන යන දුම්රිය පෙට්ටි තැනීම සඳහා ද, වෙයි.